වාර්ෂික කාර්යසාධන වාර්තාව

2021



අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැට්, බුලත් ඇතුළු
කුඩා වැවිලි බෝග වගා සංවර්ධනය ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

වැවිලි අමාත්‍යාංශය

2021

වාර්ෂික කාර්යසාධන වාර්තාව
வருடாந்த செயற்திறன் அறிக்கை
ANNUAL PERFORMANCE REPORT

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
ஏற்றுமதி விவசாயத் திணைக்களம்
DEPARTMENT OF EXPORT AGRICULTURE

උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැට්, බුලත් ඇතුළු
කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා
අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

கரும்பு, சோளம், மரமுந்திரிகை, மிளகு, கறுவா, கராம்பு, வெற்றிலை
உள்ளிட்ட சிறுபயிர்ச்செய்கை அபிவிருத்தி, அவை சார்ந்த தொழில்கள்
மற்றும் ஏற்றுமதி மேம்பாடு

State Ministry of Development of Minor Crops including
Sugarcane, Maize, Cashew, Pepper, Cinnamon, Cloves, Betel
Related Industries and Export Promotion

වැවිලි අමාත්‍යාංශය
பெருந்தோட்டக் அமைச்சு
Ministry of Plantation

පටුන පිටුව

01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරංශය 05

1.1. හැඳින්වීම 05-06

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 07

1.3. ප්‍රධාන කාර්යයන් 09

1.4. සංවිධාන සටහන 11

1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා ආයතන 13

1.5.1. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

1.5.2. දිස්ත්‍රික් කාර්යාල 13

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 15

2.1. විශේෂ ජයග්‍රහණ හා අත්පත් කර ගැනීම් 15-23

2.2. අභියෝග හා ඉදිරි ඉලක්ක 23

2.2.1. අභියෝග 23-24

2.2.2. අනාගත ඉලක්ක / අරමුණු 24-26

03. පරිච්ඡේදය - මූල්‍ය කාර්ය සාධනය 27

3.1.මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 27

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 28

3.3.මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 29

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන් 30

3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 30

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 30

3.7.මු.රෙ.208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙක් ලෙස මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 31

3.8.මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 31

3.9.විගණකාධිපති වාර්තාව 32-41

04. පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක 43

4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 43

4.1.1.අපනයන කෘෂි බෝග සංවර්ධන වැඩසටහන 43-52

4.1.2. ගොඩනැඟිලි ඉදිකිරීම්, අළුත්වැඩියා, ඉඩම් සංවර්ධනය හා යටිතල පහසුකම් 52

05.පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය 53

5.1. දෙපාර්තමේන්තුවට අදාළව හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු 53-54

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 55-58

06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ 59

6.1.සේවක සංඛ්‍යා කළමණාකරණය 59

6.2.ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපා ඇති ආකාරය 59

6.3.මානව සම්පත් සංවර්ධනය 59-60

07.පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව 61-66

ඇමුණුම 01 - අපනයන කෘෂි බෝගයන්හි ආනයන හා අපනයන පරිමාව 67

පරිච්ඡේදය 01

ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

ශ්‍රී ලංකාව පුරාතන සමයේ සිට කුරුඳු සඳහා කීර්තිනාමයක් දිනා සිටිය ද ජාතික මට්ටමෙන් මෙම කර්මාන්තය සඳහා අවධානය යොමු කෙරුණේ 1971 ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්තිය මඟින්ය. ඉන් පසුව 1972 දී අමාත්‍ය මණ්ඩල සන්දේශයක් තුළින් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට අනුබද්ධිතව සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදි. 1975 වර්ෂයේ දී මෙම දෙපාර්තමේන්තුව කෘෂිකර්ම අමාත්‍යාංශය යටතට ගෙන එන ලදි. ලෝක ආහාර වැඩසටහන (WFP)සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) මඟින් මූලාරම්භ කරන ලද බෝග විවිධාංගීකරණ සංවර්ධන වැඩසටහනේ කාර්යයන්වල කොටසක් දෙපාර්තමේන්තුවට පැවරීමත් සමඟ දෙපාර්තමේන්තුවේ එවකට කාර්යභාර්ය බවට පත්ව තිබූ මායිම් ඉඩම්වල කුළුබඩු වගා කිරීම වෙනුවට අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව කුළුබඩු ආශ්‍රිත බෝග සංවර්ධනය මත පදනම් වූ අපනයන සංවර්ධනයේ නියමුවා විය.

1992 අංක 46 දරණ පාර්ලිමේන්තු පනතින් දෙපාර්තමේන්තුව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යනුවෙන් නැවත නම් කරන ලදි. එමඟින් කුළුබඩු සහ වෙනත් කෘෂිකාර්මික බෝග අපනයනයට අදාළව නෛතික අධිකාරි බලය දෙපාර්තමේන්තුව වෙත පවරන ලදි. එතැන් සිට මෙම දෙපාර්තමේන්තුව ක්ෂේත්‍ර, පර්යේෂණ මෙන්ම සංවර්ධන ක්‍රියාකාරකම් මෙහෙයවමින් සිටියි. ඒ අනුව කුළුබඩු ක්ෂේත්‍රයේ ප්‍රවීණයා වෙමින් එහි සංවර්ධනය සහ ව්‍යාප්තිය පිළිබඳ දීප ව්‍යාප්ත ජාලයක් මඟින් දෙපාර්තමේන්තුව මෙම අංශයේ අදාල පාර්ශවකරුවන්ට පහසුකම් සපයයි.

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් ඉලක්ක කරන්නේ කුරුඳු, ගම්මිරිස්, කරාඹු, සාදික්කා, කරඳමුංගු, කෝපි, කොකෝවා, බුලත්, පුවක්, වැනිලා, පැඟිරි, සේර, ගොරකා, කිතුල්, ඉඟුරු හා කහ ආදී බෝග බාණ්ඩ කුළුබඩු බෝග ලෙස අපනයනය කිරීමයි. බෝග සංවර්ධනයේ දී කෝපි, කොකෝවා සහ වැනිලා පානීය බෝග ලෙසත්, පුවක් උත්තේජක බෝග ලෙසත් අවධානය දිනාගෙන ඇත. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීම වනුයේ ඉහළ අස්වනු ලබා දෙන තාක්ෂණික දැනුම, නවෝත්පාදන සහ බෝග වර්ග හඳුන්වා දීම වන අතර අපනයන කෘෂිබෝග ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය උදෙසා පර්යේෂණ, සංවර්ධන හා පර්යේෂණ සේවා සැපයීම අඛණ්ඩව දෙපාර්තමේන්තුව සිදු කරයි.

ඒ අනුව 2021 වසරේ දෙපාර්තමේන්තුව සඳහා වෙන් වූ රුපියල් මිලියන 700.00ක ප්‍රතිපාදන මඟින් දෙපාර්තමේන්තු සමස්ථ ප්‍රාග්ධන ප්‍රාග්ධන ආයෝජන වැඩසටහන් ක්‍රියාවට නංවන ලද අතර රුපියල් මිලියන 17.55 ක ප්‍රාග්ධන ආයෝජනයෙන් පර්යේෂණ අංශයේ කටයුතු සිදු කරන ලදි.

සමස්ථයක් ලෙස ආර්ථික සාමාජයීය ඇතුළු රටේ සියළුම අංශයන් කෙරේ විශාල බලපෑමක් සිදු කළ Covid – 19 ගෝලීය වසංගතයේ බලපෑම අපනයන කෘෂි අංශයටද අහිතකර ලෙස බලපෑම් සිදු කළද දෙපාර්තමේන්තුවේ විශේෂ මැදිහත් වීම හා කැපවීම මත එම අභියෝගයන් ජයගැනීමට 2021 වසර තුළ දී දෙපාර්තමේන්තුවට හැකිවිය.

ඉහළ ගුණත්වයෙන් යුතු කහ දේශීයව වගා කළ හැකි වුව ද කහ ආනයනයට යොමුව තිබීය. ආර්ථික අවාසි 2019 දී හඳුනා ගත් අතර ආනයන අධෛර්යමත් කිරීමටත් දේශීයව වගා කර ස්වයංපෝෂිත මට්ටමට ළඟා වීමත් අරමුණු කරගෙන කහ හා ඉඟුරු දේශියව වගාව ධෛර්යමත් කිරීම සඳහා 2021 වසර තුළ විශේෂ අවධානයක් දෙපාර්තමේන්තුව විසින් යොමු කරන ලදි. සාපේක්ෂව පෙර වර්ෂ වලට වඩා කහ භෝග වගා වපසරිය 2021 වසර තුළ ඉහළ ගිය අතර කහ නිෂ්පාදනයද 2021 වසර තුළ ස්වයංපෝෂිත මට්ටමට ඉහළ යන ලදි.

නිෂ්පාදන පරිමාව ඉහළ දමමින් අපනයන ආදායම ඉහළ නැංවීමේ දෙපාර්තමේන්තු ප්‍රධාන ඉලක්කය සපුරා ගැනීමේ දී වගා වපසරිය වාර්ෂිකව ඉහළ නැංවීම සඳහා යොමු කළ අවධානයට හා සාපේක්ෂව අපනයන භෝග වල අගය එකතු කිරීමේ නිෂ්පාදන ඉහළ නැංවීම තුළින් ඉහළ වෙළඳපල වාසි ලබා ගැනීම පිළිබඳවද විශේෂ අවධානයක් 2021 වසර තුල දී යොමු කරන ලදි.

පාලනය කළ නොහැකි බාහිර බලපෑමක් වන Covid -19 ගෝලීය වසංගත තත්ත්වයේ අහිතකර බලපෑම, දේශගුණික කාලගුණික වෙනස්කම් හා වෙළඳපල මිලෙහි බලපෑම මත වුව ද 2020 රුපියල් මිලියන72,991.98ක් ක් වූ අපනයන ආදායම 2021 වන විට රුපියල් මිලියන102,939.40ක් දක්වා ඉහළ නංවා ගැනීමට හැකිවීම, අර්බුදයක් බවට පත් වූ කහ නිෂ්පාදනය සාධනීය මට්ටමට ළඟා කර ගැනීමට හැකිවීමත් සාධනීය ලක්ෂණයක් විය.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

කුළුබඩු හා ආශ්‍රිත නිෂ්පාදනයෙන් විශිෂ්ටත්වය

මෙහෙවර

වැඩි විදේශ විනිමයක් ඉපයීමත් අපනයන කෘෂිබෝග ක්ෂේත්‍රයේ නිරත සියළු පාර්ශවකරුවන්ගේ තිරසාර ආර්ථික හා සමාජයීය සංවර්ධනයත් පෙරදැරි කර ගනිමින්, පරිසරය සුරැකෙන අයුරින් අපනයන කෘෂිබෝග නිෂ්පාදනවල ප්‍රමාණාත්මක හා ගුණාත්මක ප්‍රවර්ධනයක් ඇති කිරීමට අවශ්‍යවන්නාවූ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාවලිය සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

අරමුණු

අපනයන පරිමාව වැඩිකිරීම හා නිෂ්පාදිතයේ ගුණාත්මකභාවය උසස් කිරීම තුළින් ඉහළ විදේශ විනිමය ඉපයීමක් සඳහා අපනයන කෘෂිබෝග අංශය සංවර්ධනය කිරීම.

1.3. ප්‍රධාන කාර්යයන්

- අපනයන කෘෂි බෝග වගාව හා පිරිසැකසුම්කරණය සංවිධානය හා ප්‍රවර්ධනය.
- බෝග සංවර්ධනය, බෝග වගාව, බෝග ආරක්ෂණය, පසු අස්වනු කළමනාකරණය හා සමාජ ආර්ථික විද්‍යාව සම්බන්ධ බහු විෂයානුබද්ධ පර්යේෂණ සිදු කිරීම.
- ඉහළ ගුණාත්මකභාවයකින්යුත් රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා බෙදාහැරීම.
- බෝග නිෂ්පාදනය, ඵලදායිතා වර්ධනය හා ගුණාත්මකභාවය වර්ධනයට අදාළ අපනයන කෘෂි බෝග ආධාර යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.
- බෝග ආරක්ෂණ උපදේශන සේවා සැපයීම.
- ඒකාබද්ධ පළිබෝධ කළමණාකරණය ප්‍රවර්ධනය.
- ඒකාබද්ධ ශාක පෝෂණ කළමණාකරණය ප්‍රවර්ධනය.
- කාබනික වගාව ප්‍රවර්ධනය.
- අලෙවිකරණය, ගුණාත්මක ප්‍රමිතීන් හා මිල ගණන් ආදිය පිළිබඳ දත්ත නිකුත් කිරීම.
- අපනයන කෘෂි බෝග නිපැයුම් හා රෝපණ ද්‍රව්‍ය ආනයනය පාලනය කිරීම.
- අපනයන කෘෂි බෝග නිෂ්පාදනය, පිරිසැකසුම්කරණය, අලෙවියෙහි නියුතු පුද්ගලයින් හා අනෙකුත් පාර්ශවකරුවන් පුහුණු කිරීම.
- වැවිලි අංශය තුළ අපනයන කෘෂි බෝග ප්‍රවර්ධනය සඳහා උපදේශන සේවා සැපයීම.
- අපනයන කෘෂි බෝග ආශ්‍රිත රාජ්‍ය හා පෞද්ගලික ආයතන අතර සම්බන්ධතාව ශක්තිමත් කිරීම.
- 1992 අංක 46 දරණ අපනයන කෘෂිකර්ම පනත යටතේ විධායක අධිකාරී බලය පැවරීම.
- අපනයන කෘෂි බෝග ආශ්‍රිත ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධයෙන් අනෙකුත් රාජ්‍ය සංවිධාන වෙතඋපදෙස් සැපයීම.
- තාක්ෂණික ආදර්ශණ පවත්වාගෙන යාම.

1.4 . සංවිධාන සැලැස්ම අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව



නි.අ. - නියෝජ්‍ය අධ්‍යක්ෂ, **ස.අ.** - සහකාර අධ්‍යක්ෂ,**ව්‍යා.උ.ඒ.** -ව්‍යාපාර උපදේශන ඒකකය, **ම.ප.ම.**-මධ්‍යම පර්යේෂණ මධ්‍යස්ථානය, **පැ.සං** - පැලෑටි සංරක්ෂණය, **උ.ප.ම.** -උප පර්යේෂණ මධ්‍යස්ථානය,**ආ.ප.ඒ.**- ආර්ථික පර්යේෂණ ඒකකය,**සං.ලේ.** -සංඛ්‍යාලේඛනඥ, **අ.විගණක** - අභ්‍යන්තර විගණක, **පරි.නි.** - පරිපාලන නිලධාරී, **පරි.නි.(මෙ.)** - පරිපාලන නිලධාරී(මෙහෙයුම්), **භාෂා පරි.**- භාෂා පරිවර්තක, **පර්.සං.ස**- පර්යේෂණ හා සංවර්ධන සහකාර, **සං.ස.**- සංවර්ධන සහකාර, **අය.සහ.**- අයවැය සහකාර, **සං.නි.** - සංවර්ධන නිලධාරී, **ප්‍ර.තා.නි** - ප්‍රධාන තාක්ෂණ නිලධාරී තොා.හා සං.තා.නි - තොරතුරු හා සංනිවේදන තාක්ෂණ නිලධාරී, **කළ.ස.**- කළමනාකරණ සහකාර, **පුස්ත.**- පුස්තකාලාධිපති, **දි.ව්‍යා.නි.** - දිස්ත්‍රික් ව්‍යාප්ති නිලධාරී, **ව්‍යා.නි.**- ව්‍යාප්ති නිලධාරී, **තා.නි.**- තාක්ෂණ නිලධාරී, **කා.නි-** කාර්මික නිලධාරී, **සං.තා.සහ.** - සන්නිවේදන තාක්ෂණ සහකාර,**ගො.ක.** - ගොවිපළ කළමනාකරු,**ගො.සේ.ස.**- ගොවිපළ සේවා සහකාර, **නි.පා.** - නිවාස පාලක.

1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා ආයතන

1.5.1. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

1. සංවර්ධන අංශය
2. පර්යේෂණ අංශය
3. පාලන අංශය
4. ගිණුම් අංශය

1.5.2. දිස්ත්‍රික් කාර්යාල 17 ක් පහත අයුරින් ව්‍යාප්තව ඇත.

මධ්‍යම පළාත	- මහනුවර, මාතලේ, නුවරඑළිය
සබරගමුව පළාත	- කෑගල්ල, රත්නපුර
ඌව පළාත	- බදුල්ල, මොණරාගල
දකුණු පළාත	- ගාල්ල, මාතර, හම්බන්තොට
බස්නාහිර පළාත	- කොළඹ, කළුතර, ගම්පහ
වයඹ පළාත	- කුරුණෑගල(පුත්තලම දිස්ත්‍රික්කය ද ආවරණය වේ.)
නැගෙනහිර පළාත	- අම්පාර(මඩකලපුව දිස්ත්‍රික්කය ද ඇතුළත් වේ.)
උතුරු මැද පළාත	- අනුරාධපුර, පොළොන්නරුව

පර්යේෂණ මධ්‍යස්ථාන හා උප පර්යේෂණ මධ්‍යස්ථාන වල පිහිටීම

1. මධ්‍යම පර්යේෂණ මධ්‍යස්ථානය, මාතලේ
2. කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය, පළොල්පිටිය, තිහගොඩ, මාතර
3. අතුරුවගා හා බුලත් පර්යේෂණ මධ්‍යස්ථානය, දම්පැලැස්ස, නාරම්මල
4. ආර්ථික සහ අලෙවිකරණ පර්යේෂණ ඒකකය, ප්‍රධාන කාර්යාලය, පේරාදෙණිය
5. මැදරට පර්යේෂණ මධ්‍යස්ථානය, දැල්පිටිය ,ගම්පොල
6. පටක රෝපණ පර්යේෂණ මධ්‍යස්ථානය හා පැළ තවාන, වල්පිට ,ගම්පහ
7. උප පර්යේෂණ මධ්‍යස්ථානය, කුණ්ඩසාලේ
8. උප පර්යේෂණ මධ්‍යස්ථානය, නිල්ලඹ , ගලහ

දෙපාර්තමේන්තු මධ්‍යම පැළ තවාන්වල පිහිටීම

කුරුණෑගල දිස්ත්‍රික්කය	-	සෙරපීස් පැළ තවාන - පොල්ගහවෙල
		හොලොන්ගොල්ල පැළ තවාන - දොඩන්ගස්ලන්ද
		වෙන්නෝරුව පැළ තවාන - නාරම්මල
නුවරඑළිය දිස්ත්‍රික්කය	-	බ්ලැක්වෝටර් පැළ තවාන - ගිනිගත්හේන
		මුල්හාල්කැලේ පැළ තවාන - වලපනේ
මාතලේ දිස්ත්‍රික්කය	-	මධ්‍යම පැළ තවාන - ඇල්වල, උකුවෙල
මාතර දිස්ත්‍රික්කය	-	මධ්‍යම පැළ තවාන - මාපළාන, කඹුරුපිටිය
කෑගල්ල දිස්ත්‍රික්කය	-	මධ්‍යම පැළ තවාන - ගස්නාව, නෙලුන්දෙනිය
ගම්පහ දිස්ත්‍රික්කය	-	මධ්‍යම පැළ තවාන - වල්පිට
හම්බන්තොට දිස්ත්‍රික්කය	-	මධ්‍යම පැළ තවාන හා කුළුබඩු උද්‍යානය - මිද්දෙණිය

පරිච්ඡේදය 02

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 විශේෂ ජයග්‍රහණ හා අත්පත්කර ගැනීම්

2021 වසර තුලදී පැවැති කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ වුවද අපනයන කෘෂිබෝග ක්ෂේත්‍රය නංවාලිම හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීම තුළින් වැඩි විදේශ විනිමයක් උපයා ගැනීම අරමුණු කර ගනිමින් 2021 වසරේදී , අපනයන කෘෂි බෝග සංවර්ධන වැඩසටහන යටතේ මහා භාණ්ඩාගාරය මඟින් ලබා දුන් රු.මි.700.00 ක ප්‍රතිපාදන වලින් රු.360, 697,382.13 ක් හා අමාත්‍යාංශය මඟින් ලබා දුන් ප්‍රතිපාදන වලින් රු.71,578,022.00 ක මුදලක් අපනයන කෘෂි කලාප වැඩසටහන යටතේ,ද කහ සහ ඉඟුරු වගා වැඩසටහන සඳහා රු. 68,190,554.83 ක් හා ක්ෂුද්‍ර ජල සම්පාදන ඒකක සඳහා රු.10,773,487.48 ක් ද වූ වටිනාකමෙකින් යුතු සංවර්ධන වැඩසටහන් 2021 වසරේදී දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාවට නංවන ලදි. මෙයට අමතරව අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ 432-2-3-7-2507 වැය විෂය මඟින් රුපියල් මිලියන 30.00ක ප්‍රතිපාදන ජල සම්පාදන පද්ධති ස්ථාපනය කිරීම සඳහා දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන ලදි. එම ප්‍රතිපාදන යටතේ ගස්නාව සහ මාතලේ මධ්‍යම පැළ තවාන්හි ජල මූලාශ්‍ර ස්ථාපිත කිරීම සහ නළ පද්ධති ස්ථාපිත කිරීම හා ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය අනෙකුත් මිල දී ගැනීම් අවසන් කරන ලදි. මාතලේ මධ්‍යම පර්යේෂණ මධ්‍යස්ථානයේ නළ ළිඳක් ඉදි කිරීමක්ද සිදු කරන ලදි.

එම වැඩසටහන් වල ප්‍රතිඵල පිළිබඳ සැලකීමේ දී

- අපනයන කෘෂිබෝග වන කුරුඳු , ගම්මිරිස් , සාදික්කා , කරාඹු, කොකෝවා, කරඳමුංගු, වැනිලා සහ කෝපි, නව වගා වපසරිය හෙක්ටයාර 1635.15 ක් වූ අතර දෙපාර්තමේන්තුව මඟින් 2021 වර්ෂය සඳහා සැලසුම් කරන ලද භූමි ප්‍රමාණයෙන් 96.7% ක වගා ගත ප්‍රමාණයක් අත්පත් කර ගැනීමට හැකි විය. පෙර වසරේදී මෙන් ගොවීන් අතර අපනයන කෘෂි බෝග වගා කිරීම සඳහා ඉහළ ඉල්ලුමක් පැවති හෙයින් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ඒ සඳහා විවිධ වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදී. මෙහිදී දෙපාර්තමේන්තුව මඟින් සහතික කරන ලද අපනයන කෘෂි බෝග රෝපණ ද්‍රව්‍ය නොමිලයේ ගොවීන් වෙත ලබා දෙන ලදි. මේ යටතේ ගොවීන් සඳහා ලබා දෙන ලද අපනයන කෘෂි බෝග පැළ සංඛ්‍යාව 9,383,310 කි.
- අපනයන කෘෂිකාර්මික බෝග ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් යුතුව ගෙවතු වගා වැඩසටහන 2021 වසර තුල ද ක්‍රියාත්මක කරන ලද අතර කුඩා පරිමාණ ගෙවතු වගා වැඩසටහන හා සෞභාග්‍යා ගෙවතු වැඩසටහන මඟින් අක්කර ¼ ට අඩු කුඩා පරිමාණයේ ඉඩම් සඳහා පැළ 3,108,129 ක් ගොවීන් වෙත ලබා දෙන ලදී. මේ මඟින් කුඩා ඉඩම් හිමියන් සඳහා තම ගෙවත්ත තුළ අපනයන කෘෂි බෝග වගා කිරීම දිරිමත් කිරීමත් ඒ තුලින් නිවසේ කුළුබඩු අවශ්‍යතාවය සපුරා ගැනීමත් අරමුණු කරන ලදී.

ඒ අනුව, ගෙවතු වගා වැඩසටහන යටතේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, ගොවිජන කේන්ද්‍ර හා ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් හෝ ජාතික මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන ගෙවතු සංවර්ධන වැඩසටහන් සඳහා පැළ නොමිලේ නිකුත් කරන ලදී. එම වැඩසටහන යටතේ 120,541 ක් පැළ නිකුත් කරන ලදී.

- අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් මත රජය විසින් කහ බෝගය ආනයනය කිරීම මුළුමනින්ම සීමා කිරීමත් සමඟම කහ වගාව කෙරෙහි දේශීය වශයෙන් විශාල වගාකරුවන් පිරිසක් නැඹුරුවූ අතර, ඒ අනුව කහ වගා කිරීම සඳහා පැවතුණු ඉල්ලුම ඉහළ යාම හේතුවෙන් 2021 වර්ෂයේ අපනයන කෘෂි බෝග සංවර්ධන වැඩසටහන යටතේ කහ සහ ඉඟුරු වගා ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂයේදී ඉලක්ක ගත කහ වගා වපසරිය වැඩිකරන ලදී. මෙහිදී සක්‍රිය වගා වපසරිය උපරිම හෙක්. 01 ක් දක්වා අවම කි.ග්‍රෑ. 10 සිට උපරිම කි.ග්‍රෑ. 300 දක්වා සපයාගනු ලබන ගුණාත්මක කහ බීජ අල කි.ග්‍රෑ. 01 කට රු. 150.00 බැගින් කහ වගාකරුවන් වෙත ආයෝජන ආධාර මුදල් ලබා දෙන ලදී. ඒ අනුව, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් සියළුම දිස්ත්‍රික්කයන් හි හෙක්ටයාර 661.10 ක් තුළ කහ වගා කරන ලදී.
- මීට අමතරව ගෙවතු සඳහා කහ පැළ ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළ අතර, ඒ යටතේ ගෘහස්ථ පරිභෝජනය සඳහා අවශ්‍ය කහ - ඉඟුරු අවශ්‍යතාවය තම ගෙවත්ත තුලින් නිෂ්පාදනය කිරීම අරමුණු කරන ලදී. මෙහිදී නාගරික සහ අර්ධ නාගරික නිවෙස්වලට ප්‍රමුඛත්වය ලබාදෙමින් එක් ගෘහයක් සඳහා අවශ්‍යතාවය පරිදි කහ පැළ 05 ක උපරිමයක් දක්වාත් ඉඟුරු පැළ 05 ක උපරිමයක් දක්වාත් නොමිලේ නිකුත් කරන ලදී. මෙහිදී කහ පැළ 5,222,527 ක් සමස්ථ දිවයින පුරා බෙදා දෙන ලදී.
- එමෙන්ම, අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ කහ සහ ඉඟුරු බීජ ස්ථාපනය කිරීමේ වැඩසටහනක් ද ක්‍රියාත්මක විය. ඒ යටතේ, තම ආයතන පරිශ්‍රයන් හි කහ හෝ ඉඟුරු බීජ උද්‍යානයක් ස්ථාපනය කර ගැනීමේ අවශ්‍යතාවය සහ කැමැත්ත ඇති රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන වලට අයත් ඉඩම් වල බීජ උද්‍යාන ස්ථාපනය කරන ලදී. එහි දී, වගා වපසරිය උපරිම හෙක්. 01 ක් දක්වා අවශ්‍ය ගුණාත්මක කහ බීජ ප්‍රමාණය අදාල ආයතන වෙත නොමිලේ සපයා දීමට කටයුතු කළ අතර, ඒවායේ තාක්ෂණික උපදෙස් සහ අධීක්ෂණ කටයුතු දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් ලබාදෙන ලදී. ඉඟුරු සහ කහ බීජ ස්ථාපන වැඩසටහන මඟින්, කහ සහ ඉඟුරු වගාකරුවන්ට අවශ්‍ය ගුණාත්මක කහ ඉඟුරු බීජ හිඟයකින් තොරව සැපයීම අපේක්ෂා කරන ලද අතර, කහ වගාව රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනයන් හි ව්‍යාප්ත කර වීමට කටයුතු කරන ලදී.

- පොකුරු ගම්මාන වැඩසටහන යටතේ එක් ගම්මානයක් හෝ ගම්මාන කිහිපයක් පොකුරු ගම්මානයක් ලෙස ඒකාබද්ධ කර මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙහිදී අපනයන කෘෂි භෝග පැළ නිකුත් කිරීමේ සිට අස්වනු අලෙවි කිරීම දක්වා ක්‍රමවත් සැලැස්මක් සකස් කර ගොවීන් සවිබල ගැන්වීමට කටයුතු කරන ලදී. මෙම වැඩසටහන යටතේ ගම්මාන 98ක් සඳහා කරඳමුංගු, වැනිලා, සාදික්කා යන බෝගයන්ගේ පැළ 104,622 ක් ගම්මාන 98ක් සඳහා ලබාදෙන ලදී.

- පරිසර සංරක්ෂණය අරමුණු කර ගනිමින් 2021 වසර තුලදී ද පුවක් වගා වැඩසටහන දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන යටතේ පුවක් පැළ 1,099,420 ක ප්‍රමාණයක් ගෙවතු . රාජ්‍ය , පුද්ගලික ආයතන හා වතු සමාගම් වෙත බෙදා දෙන ලදි.

- අපනයන කෘෂි බෝග නිෂ්පාදනයන් ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් ප්‍රධාන අංශ තුනක් යටතේ ඵලදායීතාවය ඉහල නැංවීමේ වැඩසටහන ක්‍රියාවට නංවන ලදී. යහපත් ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම අනුගමනය කිරීම තුලින් පවත්නා වගාවන්හි ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා පාළු පැළ නොමිලයේ ලබා දීම , අපනයන කෘෂි බෝග කාලගුණ විපර්යාසවලට අනුහුරු කිරීම සඳහා සුදුසු ජල සම්පාදන ක්‍රම හඳුන්වාදීම තුලින් පවතින අපනයන කෘෂි බෝග වගාවන් ජල හිඟ තත්ත්වයන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍ය ක්ෂුද්‍ර ජල සම්පාදන ඒකක ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය ආයෝජන ආධාර ලබා දීම හා අපනයන බෝග වලට හානි කරන පලිබෝධ හා සත්ත්ව හානි වළක්වා ගැනීමේ අරමුණින් උපාංග හා පද්ධති හඳුන්වා දෙන ලදී. ඒ අනුව බිංදු හා විසිරි ජල සම්පාදන පද්ධති 56ක්, අරක්ෂිත වැටවල් හා වගා ආරක්ෂිත පද්ධති 80 ක් ස්ථාපනය සඳහා වැයවන පිරිවැයෙන් 50% ක් අයෝජන ආධාර ක්‍රමය යටතේ කටයුතු සිදු කරන ලදි.

  අපනයන කෘෂිබෝග නිෂ්පාදන වල පසු අස්වනු තාක්ෂණ ක්‍රියාවලිය විධිමත් කිරීම තුලින් නිෂ්පාදන ගුණාත්මය ඉහල නැංවීම, අගය වැඩිකල නිෂ්පාදන සඳහා දිරිමත් කිරීම සහ රාජ්‍ය ආයෝජන ආධාර ලබා දීමේ ක්‍රියාවලිය විධිමත් කිරීමේ අපේක්ෂාවෙන් උචිත තාක්ෂණය භාවිතයෙන් අපනයන කෘෂිබෝග ගුණත්වය වැඩි දියුණු කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක වේ. මෙම ආයෝජන ආධාර ක්‍රමය හුදෙක් අස්වනු සැකසීමේ නවීන තාක්ෂණික උපකරණ / යන්ත්‍රසූත්‍ර / ගොඩනැගිලි / පහසුකම් හඳුන්වා දීම හා සැපයීමේ ක්‍රියාවලියක් පමණක්ම නොව අපනයන බෝග වගාවන්ගේ ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රියාමාර්ග ඉටු කිරීමට, දේශීය හා විදේශීය ප්‍රමිතීන්ට අනුව යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP) අනුගමනය කරමින් අපනයන කෘෂිබෝග නිෂ්පාදනයන් හි ගුණාත්මය වැඩිදියුණු කිරීම, අගය එකතු කල නිෂ්පාදන දිරිගැන්වීම (Value Addition), රැකියා උත්පාදනය ඉහල නැංවීම උදෙසා වන සමස්ථ ක්‍රියාවලියක් සඳහා යොමු වූවකි.

- 2021 වර්ෂයේදි දෙපාර්තමේන්තුව මඟින් පසු අස්වනු තාක්ෂණ ආයෝජන ආධාර ක්‍රමය යටතේ කුඩා හා මධ්‍ය පරිමාණ කුරුඳු පිරිසැකසුම් මධ්‍යස්ථාන 58 ක් , අනෙකුත් පිරිසැකසුම් මධ්‍යස්ථාන 04 සහ කේන්ද්‍රීය පිරිසැකසුම් මධ්‍යස්ථාන 09 ක් සඳහා ආයෝජන ආධාර ලබාදෙන ලදි. පසු අස්වනු තාක්ෂණය යාන්ත්‍රිකරණය තුළින් අස්වනු වල ඉහළ ගුණාත්මකභාවයක් ලබාගැනීම හා මිනිස් ශ්‍රමය අවම ලෙස භාවිතය තුළින් නිෂ්පාදන වියදම අඩුකිරීම සඳහා හා යන්ත්‍රෝපකරණ 396 ක් හා කුරුඳු තෙල් නිස්සාරණ ඒකක 18 ක් සඳහා ආධාර ලබාදෙනලදි.

- කාබනික නිෂ්පාදන සඳහා ලෝක වෙළඳපොල (Niche Market) ඉලක්ක කර ගනිමින් කාබනික කෘෂි බෝග වැඩසටහන අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් 2021 වසර තුලදී ද ඉදිරියට ගෙන යන ලදී. නව කාබනික වගා හෙක්ටයාර 47.5 ක් ආරම්භ කරන ලද අතරම පසුගිය වසරවල ආරම්භ කරන ලද කාබනික වගා හෙක්ටයාර 85 ක් හා 2021 වසරේ

ආරම්භ කරන ලද කාබනික වගා හෙක්ටයාර 59.8 ක් සඳහා අවශ්‍ය මූල්‍ය දායකත්වය ලබා දෙන ලදී. දැනටමත් ආරම්භ කර ඇති කාබනික ගම්මාන පිහිටුවා ඇති යටවත්ත, පුස්සැල්ල හා දිවුලපිටිය කාබනික ගොවි සංවිධාන 03 ක් සඳහා ජාත්‍යන්තරව පිළිගත් කාබනික සහතිකය ලබා ගැනීම වෙනුවෙන් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සිය තාක්ෂණික සහ මූල්‍යමය දායකත්වය ලබා දී ඇත.

- අපනයන කෘෂි බෝග සඳහා වූ යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) වැඩසටහන යටතේ ගම්මිරිස්, කුරුඳු, කෝපි සහ කොකෝවා වගාවන් සඳහා GAP සහතික ලබා දීම වෙනුවෙන් එහි මූලික අදියරේ වැඩ කටයුතු ලෙස අදාල ප්‍රමිතීන් සකස් කිරීම හා භාවිතයන් සංග්‍රහයන් (Code of Practice) සකස් කිරීම අවසන් කරන ලදී. ලැබී ඇති අයදුම්පත් 429 ක් සඳහා GAP විගණන කටයුතු ආරම්භ කර ඇත.

- අපනයන කෘෂි බෝග නිෂ්පාදනවල ගුණාත්මය සහතික කිරීම පිණිස ආරම්භ කරන ලද සහතිකකරණ වැඩපිළිවෙල යටතේ අපනයන බෝග නිෂ්පාදන ආයතන දෙකක් සඳහා උපද්‍රව විශ්ලේෂණය හා අවධානම් පාලන ස්ථාන (HACCP) පිළිබඳ සහතිකයක් සහ ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ කළමනාකරණ පද්ධති (ISO 2200) සහතිකයක් මෙන්ම ගෝලීය ප්‍රමිතීන් පිළිබඳව බ්‍රිතාන්‍ය සිල්ලර වෙළඳ සංගමය විසින් ලබා දෙන සහතිකය (BRCGS) 2021 වර්ෂයේදී ලබා දීම සිදු කර ඇත. මේ සඳහා අවශ්‍ය තාක්ෂණික හා මූල්‍ය දායකත්වය අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් සපයන ලදී.

- අපනයන කටයුතුවල නියැලෙන දේශීය හා විදේශීය ආයතන 11 ක් සහ කාබනික සහතික ලත් ගොවි සංවිධානවල නිෂ්පාදන අලෙවි කිරීම වෙනුවෙන් අවශ්‍ය සම්බන්ධීකරණය සිදු කර ඇති අතර අළුතින් කුළුබඩු ක්ෂේත්‍රය වෙත පිවිසීමට අපේක්ෂිත පුද්ගලයින් වෙනුවෙන් තනි පුද්ගල උපදේශන සේවා සැපයීම් 134 ක් සිදු කර ඇත.

- අපනයන කෘෂි බෝගයන්හි උසස්, ගුණාත්මක අස්වැන්නක් ලබා ගැනීම සඳහා ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය භාවිතය වඩා වැදගත් වන අතර, 2021 වසර තුල ගොවීන් වෙත උසස් ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය ලබා දීමේ අරමුණ ඇතිව, දෙපාර්තමේන්තු පැළ තවාන් 12 ක් හා පෞද්ගලික පැළ තවාන් 739 ක් මඟින් අවශ්‍ය රෝපණ ද්‍රව්‍ය සපුරා ගන්නා ලදී. 2021 වසරේදී දෙපාර්තමේන්තුවේ ගස්නාව පැළ තවාන සඳහා මවු ශාක උද්‍යානයක් ස්ථාපිත කිරීම, අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ගස්නාව සහ මාතලේ ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති පිහිටුවන ලද අතර අනෙකුත් මධ්‍යම පැළ තවාන් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සපයන ලදී. ඒ අනුව, 2021 වසරේදී දෙපාර්තමේන්තු හා මධ්‍යම පැළ තවාන්වල පැළ මිලියන 2.7 ක් නිෂ්පාදනය කර , පැළ සහතික කිරීමේ ක්‍රියාවලිය යටතේ පැළ මිලියන 2.05 ක් දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් හරහා ගොවීන් වෙත බෙදා දෙන ලදී. තවද වෙළෙඳපල මිල ඉහළ යාම හේතුවෙන් බීජ මිල වැඩි කිරීමට කටයුතු කරන ලද අතර ඒ අනුව, 2021 අප්‍රියෙල් මස 09 වන දා සිට පුවක් බීජයක මිල රු. 4.00 දක්වා ද 2021 ජූලි මස 22 වන දින සිට සාදික්කා බීජයක මිල රු. 13.00 දක්වා ඉහළ නංවන ලදී.

- අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සියළු නිළධාරීන්ගේ අභ්‍යන්තර පුහුණු කටයුතු හා සියළුම පාර්ශ්වකරුවන්ගේ තාක්ෂණික දැනුම යාවත්කාලීන කිරීම් පිළිබඳ වගකීම දරන සේවා සංස්කරණ පුහුණු මධ්‍යස්ථානය 2021 වසර තුල පැතිර ගිය කොවිඩ් -19 වසංගතයේ ව්‍යාප්තියත් සමඟ වුවද වසරේ මුල් කාලය තුල පුහුණු කටයුතු ආරම්භ කරන ලදී. ඒ අනුව, පසු අස්වනු තාක්ෂණික ඵලදායීතාවය ඉහළ නැංවීමේ පුහුණු හා නිළධාරී පුහුණු කටයුතු අනුමත සෞඛ්‍ය රෙගුලාසි යටතේ සිදු කරන ලදී. වරින්වර රට තුල වසංගත තත්ත්වයන් උද්ගත වීම හේතුවෙන් පිරිස් ඒකරාශී වීම නවතා දැමීම හේතුවෙන් පුහුණු මධ්‍යස්ථානයේ නේවාසිකාගාරය කොවිඩ් නිරෝධායන මධ්‍යස්ථානයක් සඳහා ලබා දීමට සිදු විය. මේ හේතුවෙන් පුහුණු වීම් සඳහා පවතින බාධක මඟහරවා ගැනීම සඳහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අපනයන කෘෂි තාක්ෂණික විද්වත් කතිකාවත නමින් දෙපාර්තමේන්තු හා දෙපාර්තමේන්තුවට පරිබාහිර සම්පත්දායකයින්ගේ සේවය යොදවා ගනිමින් , ගොවීන් ඇතුළු දිවයින පුරා විසිරී සිටින පාර්ශ්වකරුවන් වෙත මාර්ගගත Zoom තාක්ෂණය මඟින් පුහුණු වැඩසටහන් මාලාවක් සතිපතා අඛණ්ඩව පැවැත්වීමට කටයුතු කරන ලදී. මෙම වැඩසටහන් මඟින් අපනයන කෘෂි බෝග වගා ගැටළු, පසු අස්වනු තාක්ෂණික ක්‍රමවේද හා ව්‍යවසායක අවස්ථාවන් පිළිබඳ විද්වත් කතිකාවත් සිදු කරන ලදී. මෙහිදී දෙපාර්තමේන්තු නිලධාරීන් 40 දෙනෙකු හා අනෙකුත් ආයතනයන් හි නිළධාරීන් 151 ක් දෙනෙකු හා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ප්‍රතිලාභීන් 1250 ක් සඳහා අවශ්‍ය පුහුණුවීම් සිදු කරන ලදී. මාතර පළොල්පිටිය ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය මඟින් කුරුඳු වගාවේ යහපත් කෘෂිකාර්මික පිළිවෙත්, යහපත් නිෂ්පාදන පිළිවෙත් හා කුරුඳු වගාවේ වගා පාලන කටයුතු, රෝග හා පළිබෝධ පාලන කටයුතු පිළිබඳ පුහුණු වැඩසටහන් පවත්වන ලදී.
- ඉතිහාසයේ ඉහළම අපනයන ආදායම වාර්තා කිරීම හේතුවෙන් 2021 වර්ෂය අපනයන කෘෂිකර්ම ක්ෂේත්‍රයට කැපී පෙනෙන වර්ෂයක් වේ. ගෝලීය වසංගත තත්ත්වයක් යටතේ වුවද 2021 වර්ෂය තුළ දී අපනයන කෘෂි බෝග මෙට්‍රික් ටොන් 62,580.86 ක් අපනයනය කිරීමෙන් රුපියල් මිලියන 102,939.4 ක ආදායමක් උපයා ඇත. පූර්ව වර්ෂයට වඩා 2021 වර්ෂයේ දී අපනයන පරිමාවේ 20.38% ක වැඩිවීමක් සහ අපනයන ආදායමේ 41.03% ක වැඩිවීමක් දැකිය හැකි වේ. කුරුඳු , ගම්මිරිස්, කරාඹු, කරඳමුංගු, වසාවාසි, කෝපි, වැනිලා සහ තෙල් වර්ග වන කුරුඳු කොළ තෙල්, ගම්මිරිස් තෙල්, කරඳමුංගු තෙල්, සාදික්කා තෙල්, වසාවාසි තෙල් යන ඒවා 2020 වර්ෂයට වඩා අපනයනයේ වැඩිවීමක් දැකිය හැකි විය.
- කුරුඳු සැලකීමේ දී අපනයන පරිමාව මෙට්‍රික් ටොන් 18,813.52 ක් වන අතර එය පූර්ව වර්ෂයට වඩා 0.49% ක වැඩිවීමක් වේ. කුරුඳු අපනයනය කිරීමෙන් 2020 වර්ෂයේ රුපියල් මිලියන 38,218.08 ක ආදායමක් උපයා ඇති අතර එය 2021 වර්ෂයේ රුපියල් මිලියන 45,879.17 ක් වන අතර 20.04% ක වර්ධනයක් වේ. 2020 වර්ෂයේ මුළු අපනයන ආදායමෙන් 48.5 % ක් උපයා ඇත්තේ කුරුඳු අපනයනයෙන් වේ. ගම්මිරිස් අපනයන පරිමාවේ සහ අපනයන වටිනාකමේ ත්‍රීවර වැඩිවීමක් පූර්ව වර්ෂයට වඩා 2021 වර්ෂයේ දී දැකිය හැකි විය. 2020 වර්ෂයට වඩා ගම්මිරිස් අපනයන පරිමාවේ 98.74 % ක වැඩිවීමක් සහ අපනයන වටිනාකමේ 148.31 % ක වැඩිවීමක් සිදු ව ඇත.

20වර්ෂයේදී අපනයන කෘෂිභෝග වල ආනයනය කිරීම් 2020වර්ෂයට වඩා පහත වැටී ඇති අතර ආනයන පරිමාව %5.69කින්ද ආනයන වියදම් %31.8කින්ද පහත වැටී ඇත .ආනයන වියදම් වලින් %88ක්ම වැය වී ඇත්තේ කොකෝවා සහ කොකෝවා නිෂ්පාදන ආනයනය සඳහාය .අපනයන කෘෂිභෝග අතරින් කුරුඳු, කරඳමුංගු, වැනිලා, ඉඟුරු සහ කහ යන භෝග 2020වර්ෂයට සාපේක්ෂව ආනයනය අඩු වී ඇති අතර කුරුඳු කොළ තෙල්, කුරුඳු පොතු තෙල්, ගම්මිරිස් ,ගම්මිරිස් තෙල්, කරාඹු, කරාඹු තෙල්, කොකෝවා, කෝපි, පුවක්, වැනිලා තෙල්, සිට්‍රොනෙල්ලා තෙල්, ලෙමන්ග්‍රාස් තෙල් සහ ඉඟුරු තෙල් යන ඒවායේ අපනයනය 2020ට වඩා සාපේක්ෂව වැඩි වී ඇත.

- ගම්මිරිස් මිල 2016 සිට 2018 දක්වා සහ නැවතත් 2020 දක්වාත් පහත වැටීම සිදු වූ අතර ඉන් අනතුරුව 2021 දී එය ක්‍රමිකව වැඩිවීම සිදුවිය. 2021 වසරේ අවසාන කාර්තුවේ දී ගම්මිරිස් වෙළඳපොලේ සාමාන්‍ය මිල අගය කිලෝග්‍රෑම් 01 කට රුපියල් 1000.00 කට වඩා වැඩිවීම සිදුවිය.

- 2021 වර්ෂයේ අගභාගය වන විට කොවිඩ් 19 වසංගත තත්ත්වය පාලනය කරන ලද මට්ටමකට පැමිණි අතර අපනයන කෘෂි බෝග සම්බන්ධ ගොවිපල කටයුතු සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් සාමාන්‍ය තත්ත්වයට පැමිණීම නැවත සිදු විය. මෙහිදී වඩාත්ම කැපී පෙනෙන සිදු වීම වූයේ 2021 ගෝලීය වසංගත තත්ත්වයේ වුව ද ශ්‍රී ලංකාවේ අපනයන කෘෂිකර්ම ක්ෂේත්‍රය වාර්තාගත අපනයන ආදායමක් ඉපයීමයි.

- කහ අපනයනය සම්පූර්ණයෙන් තහනම් කිරීමත් සමඟ ඊළඟ වර්ෂයේ දේශීය කහ අවශ්‍යතාවය සපුරාලීම සඳහා 2021 වර්ෂයේ කහ වගාව දිරිමත් කිරීමට අවශ්‍ය පියවරයන් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ගන්නා ලදි. කහ වල නිෂ්පාදනතාවය වැඩිකිරීමේ සහ ගුණාත්මය වැඩිදියුණු කිරීමේ පර්යේෂණ වැඩසටහන් වලට අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පර්යේෂණ අංශය විසින් දායකත්වය ලබා දෙන ලදි.

- විවිධ කහ සැකසීමේ ක්‍රම සම්බන්ධයෙන් පර්යේෂණයන් සිදු කළ අතර එහි දී කහ වල ගුණාත්මයට එහි දී බලපෑම අධ්‍යයනය කරන ලදි. මෙහි ප්‍රතිඵල වලින් හෙළ වූයේ දේශීය කහ හා ඉන්දියන් කහ අතර කර්කියුමින් ප්‍රතිශතයේ සහ භෞතික හා රසායනික වෙනස්කම් ඇති බවයි. උසස් ගුණාත්මයෙන් යුත් කහ ලබා ගැනීම සඳහා තැම්බීම අත්‍යවශ්‍ය වේ. වඩාත්ම සුදුසු වියළීමේ ක්‍රමය වනුයේ කහ පෙති කෘත්‍රිමව වියළීමයි.

- කහ ජාන දර්ශක 20ක් පහතරට අතරමැදි කලාපයේ (ILia) ඇගයීම් කළ පසු පඳුරකට 1011.2 g ක අස්වැන්නක් ලබා දුන් AmpT4 ජාන දර්ශකය ඉහළම අස්වැන්නක් ලබා දෙන ජාන දර්ශකය ලෙස තෝරා ගන්නා ලදි.
- ග්ලිරිසීඩියා කොළ සහ ගොමපොහොර වැනි කාබනික ද්‍රව්‍ය යෙදීමෙන් ගම්මිරිස්වල ක්ෂණික මැලවීමේ රෝගය පාලනය කර ගත හැකිබව නිරීක්ෂණය කරන ලදී.

- ජනක ප්ලාස්ම සංරක්ෂණය ඉතා වැදගත් වේ. එය ජෛව විවිධත්වය සුරැකීම හා අනාගත පර්යේෂණ කටයුතු සඳහා ප්‍රයෝජනවත් වේ. බුලත් ජනක ප්ලාස්ම 46ක් ප්ලාස්ටික් පෝච්චි තුළ එනම් ස්ථානීය නොවන සංරක්ෂණයක් සිදු කරන ලදි.
- වෙළඳ බෝගයක් වන බුලත් මඟින් සැලකිය යුතු ප්‍රමාණයක් විදේශ විනිමය ඉපයීම සිදු කරනු ලැබේ. කුරුණෑගල දිස්ත්‍රික්කය ප්‍රධාන වශයෙන්ම බුලත් වගා කරනු ලබන දිස්ත්‍රික්කය වේ. මෙම දිස්ත්‍රික්කයේ බුලත් වගා කරනු ලබන විවිධ ප්‍රදේශවල පාංශු සාරවත් භාවය පිළිබඳ අධ්‍යයනය කරන ලදි.
- රාජ්‍ය ප්‍රතිපත්තියක් ලෙසට හරිත කෘෂිකර්මය ක්‍රියාත්මක කිරීමේ දී කුරුඳු පැළ තවාන් වල රෝග හා පළිබෝධ පාලනය සඳහා කාබනික ද්‍රාවණ භාවිතා කිරීමේ හැකියාව පිළිබඳ අධ්‍යයනය කරන ලදි. කොළ අංගමාරය පාලනය කිරීම සඳහා හොඳම විසඳුම ලෙස ෆොලිකර් වෙනුවට බෝඩෝ මිශ්‍රණය , දිය කරන ලද සල්ෆර් සහ කොහොඹ නිස්සාරණය යන ඒවායින් ද මධ්‍යස්ථ ලෙස කොළ අංගමාරය පාලනය කළ හැකි බව අනාවරණය විය. පත්‍රවල යටි පැත්තේ මයිටාවන් විසින් ඇති කරනු ලබන ගැටිති සඳහා දිය කරන ලද සල්ෆර් මඟින් අනෙක් මර්ධන ක්‍රම වලට වඩා සාර්ථක බව පෙන්නුම් කරන ලදි. දළඹුවන් මර්ධනය සඳහා බෝඩෝ මිශ්‍රණය ද කුරුඳු බීජ පැළ සඳහා සල්ෆර් ප්‍රතිකාරකයද සාර්ථක ප්‍රතිඵල ලබා දුනි.
- මෑතකදී ශ්‍රී ලංකාවේ කුරුඳු වගාවන්ට සහ පැළ තවාන් වලට පළිබෝධකයක් වූ කුරුඳු පැළ මැක්කා හඳුනාගැනීම සහ වර්ගීකරණය කිරීම සිදු කරන ලදි. විශේෂයෙන්ම පැළ තවාන් වලදී විනාශකාරී පළිබෝධකයෙකුවූ මෙම කෘමියා Helionothrips annosus Wang ලෙස හඳුනාගත් අතර විද්‍යාත්මක ලක්ෂණ ද වාර්තා ගත කරන ලදි. ශ්‍රී ලංකාවේ Thysanoptera පිරික්සුම් ලැයිස්තුව ද යාවත්කාලීන කරන ලදි.
- වර්ෂා ජලය වේගයෙන් බැස යන බෑවුම් සහිත බිම්වල පිහිටි කුරුඳු වගාවල කුරුඳු කඳ විඳින සලඹයා පාලනය කිරීම සඳහා කඳ පාමුලට පස් එකතු කිරීම වෙනුවට විකල්ප ක්‍රමයක් ලෙසට මැටි මිශ්‍ර ආවරණයක් යෙදීම වඩා සුදුසු බව හඳුනා ගන්නා ලදි.
- ශ්‍රී ලංකාවෙන් වාර්තාවන කුරුඳු පත්‍ර කනින්නා වර්ගීකරණ හඳුනා ගැනීම සිදුකළ අතර Acrocercops spp ලෙසට හඳුනා ගන්නා ලදි.
- ගම්මිරිස්වල කඩින් කඩ මල් ඇතිවීමට හේතුව අක්‍රමවත් වර්ෂාපතන රටාව වේ . මේ හේතුවෙන් අස්වැන්නේ අඩුවීමක් සිදු වේ.
- ශ්‍රී ලංකාවේ වගා කරන සාදික්කා වල ඇති රසායනික සංයෝගයන් සහ ප්‍රතිඔක්සිකාරක ගුණයන් හඳුනා ගන්නා ලදි.
- ශ්‍රී ලංකාවේ වෙළඳපොලේ ඇති කහ කුඩුවල භෞතික හා රසායනික ගුණාංග පිළිබඳව විශ්ලේෂණයක් කරන ලදි. ශ්‍රී ලංකාවේ ගොවි ක්ෂේත්‍ර වලින් ලබා ගන්නා ලද කහ වල ඇති කර්කියුමින් ප්‍රතිශතය 6% කටත් වඩා වැඩිවන නමුදු දේශීය වෙළඳපලේ ඇති කහ කුඩු වල

පවතින කර්කියුමින් ප්‍රතිශතය 3% කටත් වඩා අඩු වන බැවින් ඒවා ශ්‍රී ලංකාවේ තත්ත්වයවන්ට අනුකූල නොවේ.

- ඉඟුරු වල අස්වැන්න නෙලීමේ සිට අළුතෙන් පිටුවීම දක්වා වූ කාල පරාසය වෙනස් කරමින් ඊළඟ පැළවීමේ දී අංකුර ඇතිවීමේ හැකියාව පිළිබඳ අධ්‍යනය කරන ලදි. ඉඟුරු වාරයේ දී මෙන්ම අවාරයේ දීත් ගබඩා මාධ්‍යයක් රහිතව ගබඩා කරන ලද ඉඟුරු වල රෙසෝමයේ ඇති ජල ප්‍රමාණයේ අඩුවීමක් සිදුවිය. ඉහළ තෙතමන ප්‍රමාණයක් සංරක්ෂණය කරනු ලබන දහයියා, ලී කුඩු වලට වඩා හොඳ ගබඩා මාධ්‍යයක් විය. උපරිම ගබඩා කාලයක් ලබා දෙන ලී කුඩු වලින් 50% ක් පැළ වීමට ගතවන අඩුම කාලය වාර්තා විය. ඉඟුරු අස්වැන්න නෙලීමෙන් අනතුරුව සති 50 ක කාලයක් තබා සිටුවීමෙන් , ඉඟුරු බීජ ඉක්මනින් අංකුර මතු වීම සිදු වේ.
- ගම්මිරිස් වැල් සඳහා සුදුසුම ආධාරක ශාකය ලෙසට කොට්ට පුළුන් ශාකය තෝරාගෙන ඇත . උප වැළකින් ලබා දෙන අඩුම තෙත් බර ලබා දෙන ලද්දේ කොට්ට පුළුන් ශාකය ආධාරක ලෙසට භාවිතා කරන ලද ගම්මිරිස් වැල් වේ.
- ඉහළ ආර්ථික වටිනාකම නිසා එනසාල් වගාවට වන ඉල්ලුම වැඩි වෙමින් පවතී . වගාවට සුදුසු වන ඉඩම් වල සීමාකාරී බව නිසා එනසාල් වගාව ව්‍යාප්ත කිරීම සීමා වී තිබේ. වැඩි ආර්ද්‍රතාවය, අඩු උෂ්ණත්ව තත්ත්වයන් සමඟ ප්‍රශස්ථ පාංශු තෙතමනය සහිත කාබනික ද්‍රව්‍ය බහුල පස, එනසාල් වගාව සඳහා ප්‍රශස්ථ වේ. එබැවින් එනසාල් වගාව ව්‍යාප්ත කිරීම සඳහා නව අවස්ථා සෙවීම කළ යුතු වේ. මේ සඳහා පරීක්ෂණයක් කරන ලද අතර මෙහි දී පහත රට සෙවණ දැල් යටතේ වගාවන් ස්ථාපනය කරන ලදි. මෙහි ද නිරීක්ෂණය වූයේ 60% -70% ක සෙවණ දැල් යටතේ දී අතිරේක ජල සම්පාදන පහසුකම් යටතේ දී එනසාල් වගා කළ හැකි බවයි.
- එනසාල්/කරඳමුංගු බීජ ප්‍රරෝහණය සඳහා නයිට්‍රික් අම්ලයේ සහ ෆෝමික් අම්ලයේ බලපෑම සංසන්දනය කරන ලදි. මෙම සතුව තද බීජාවරණයක් පැවතීම හේතුවෙන් ප්‍රරෝහණය හැකියාව සීමා වී තිබේ. සාමාන්‍යයන් එනසාල් බීජ වල ප්‍රරෝහණ ප්‍රතිශතය 30% ක් පමණ වේ. 70% ක පමණ ප්‍රරෝහණ ප්‍රතිශතයක් ලබා ගැනීම සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් 25 % ක සාන්ද්‍රණයෙන් යුතු නයිට්‍රික් අම්ලය බීජ ප්‍රකිතාරකයක් ලෙස යෙදීම නිර්දේශ කර ඇත. ගොවිපල මට්ටමේ දී අධි සාන්ද්‍රණයෙන් යුත් නයිට්‍රික් අම්ලය භාවිතයේ සුරක්ෂිතභාවය සහ සෞඛ්‍යය පිළිබඳ ගැටළු ඇති කරයි. මෙයට විසඳුමක් ලෙස පර්යේෂණයක් මඟින් සාන්ද්‍ර ෆෝමික් අම්ලය බීජ ප්‍රතිකාරකයක් ලෙසට භාවිතා කිරීමේ හැකියාව පිළිබඳව ඇගයීමක් සිදු කරන ලදි. මෙහි ප්‍රතිඵලයක් ලෙසට 25% ෆෝමික් අම්ලයේ විනාඩි 10 ක් එනසාල් බීජ තැබීම මඟින් 85 % ක් දක්වා බීජ පැළවීම වැඩිවීමක් නිරීක්ෂණය කර ඇත. සාන්ද්‍ර ෆෝමික් අම්ලය වෙළඳපොලේ බහුලව පවතින අතර එය රබර් කිරි කැටි ගැහීම සඳහා භාවිතා කරයි.

- පැළ තවාන් මිශ්‍රණ සඳහා ඛණිජ පොහොර එක් කිරීමේ දී ගම්මිරිස් පැළ වල වර්ධනය සහ දිරිය සම්බන්ධයෙන් අධ්‍යයනයක් කරන ලදි. පැළ තවාන් වල ඇති ගම්මිරිස් පැළ වල ප්‍රශස්ථ වර්ධනය සඳහා නිර්දේශිත මිශ්‍රණය වනුයේ මතුපිට පස්, ගොම පොහොර, කොහුබත්, වැලි, 1:1:1:1 වේ. නමුත් ගොම පොහොර ලබා ගැනීමේ අපහසුතාවය නිසා මතුපිට පස්, කොහුබත්, වැලි 2:1:1 අනුපාතයෙන්ද යෙදිය හැකි අතර එයට ඛණිජ පොහොර 1g ක් පෝෂක සකසන මූලාශ්‍ර ලෙස එක් කළ යුතු වේ. 8*5 ප්‍රමාණයේ බඳුනකට පොස්පේට් පොහොර 1g ක් {ඩයි ඇමෝනියම් පොස්පේට් (N: P: K: 18:46:0)} යෙදීම වඩා සුදුසු පෝෂක මූලාශ්‍රය ලෙසට හඳුනාගෙන ඇත. මීට අමතරව 8*5 ප්‍රමාණයේ බඳුනක් සඳහා සංයුක්ත පොහොර නයිට්‍රජන්: පොස්පරස්: පොටෑසියම් 12:11:18 යන අනුපාතයෙන් යෙදීම හෝ 8*5 ප්‍රමාණයේ බඳුනක් සඳහා සංයුක්ත පොහොර 1g ක් එනම් නයිට්‍රජන් : පොස්පරස්: පොටෑසියම් 15:15:15 යන අනුපාතයන්ගෙන් (පොටෑසියම් සපයනු ලබන්නේ සල්පේට් ඔෆ්පොටෑෂ් වලින් වේ.) ද ලබා දිය හැකි වේ. නමුත් 8*5 ප්‍රමාණයේ බඳුනකට සංයුක්ත පොහොර 2g කට වඩා නොයෙදීමට වග බලා ගත යුතු වන්නේ එසේ වුවහොත් එයින් පැළයට ඍණාත්මක බලපෑමක් ඇති විය හැකි බැවිනි.
- ඉහුරු වල රෝග හා පළිබෝධ පාලනය සඳහා ඒකාබද්ධ පළිබෝධ පාලන පැකේජයක් ඇති කරන ලදී.

2.2 අභියෝග හා ඉදිරි ඉලක්ක

2.2.1. අභියෝග

1. 2021 වර්ෂයේදී පැවැති කොරෝනා වසංගත තත්ත්වය හමුවේ වුවද දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. වරින්වර ක්‍රියාත්මක වූ ඇඳිරිනීති තත්ත්වයන් තුලදී වුවද, දෙපාර්තමේන්තුව මඟින් වෙබ් අඩවිය, Face book , Zoom වැනි අන්තර්ජාල පහසුකම් මෙන්ම රූපවාහිනී සහ ගුවන්විදුලි වැඩසටහන් හා දුරකථන මාර්ගයෙන් දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් අපනයන කෘෂි බෝග වගාවන් පිළිබඳ අවශ්‍ය තාක්ෂණික උපදෙස් හා මඟ පෙන්වීම් සිදු කරන ලදී.

2. ගොවි බිමට අවශ්‍ය තාක්ෂණය ගොවි බිම් වෙත රැගෙන යාම වඩා කාර්යක්ෂම කිරීම සඳහා කෘෂි ව්‍යාප්ති සේවාව වඩාත් ඵලදායී කාර්යයක් ඉටු කලද, දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය ක්ෂේත්‍ර නිලධාරීන් සංඛ්‍යාව සහ දැනට සේවයේ නියුක්ත වන ක්ෂේත්‍ර නිලධාරීන් අතර විශාල පරතරයක් පවතී. මෙම ව්‍යාප්ති නිළධාරීන් බඳවා ගැනීම අත්‍යවශ්‍ය වේ.

3. කොරෝනා තත්ත්වය හමුවේ දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය භෞතික පහසුකම් ප්‍රශස්ත මට්ටමෙන් සැපයීමට නොහැකියාවක් පැවති අතර නිලධාරීන් සඳහා කාර්යාල පහසුකම්, උපකරණ හා භාණ්ඩ අවශ්‍යතාවයන් හා ප්‍රවාහන පහසුකම් නියමිත පරිදි සැපයීමට තරම් ප්‍රමාණවත් ප්‍රතිපාදන දෙපාර්තමේන්තුව සතුව නොමැති වීම අභියෝගයක් විය.

4. 2021 වර්ෂයේ කොවිඩ් 19 වසංගත තත්ත්වයේ දෙවන හා තුන්වන රැලිවල බලපෑම හේතුවෙන් ලොවපුරා මිනිසුන්ගේ ජීවිත වලට බලපෑම් ඇතිවිය. ශ්‍රී ලංකාව තුළ ද කොවිඩ් 19 හේතුවෙන් විටින් විට රට වසා දැමීම , පළාත් අතර සංචරණය සීමා කිරීම් නිසා අපනයන කෘෂිකර්ම ක්ෂේත්‍රයට ද බලපෑම් ඇති විය. අපනයන වෙළඳුන්ට අපනයන මිල දී ගැනීම් සඳහා පහසුකම් තිබූ නමුදු නිෂ්පාදකයින්ට අසීරුතාවලට මුහුණ දීමට සිදු විය. එයට හේතුව වූයේ විශේෂයෙන්ම ප්‍රවාහන අපහසුතා නිසා සහ රට වසා තිබූ කාල පරිච්ඡේද වලදී මිල දී ගැනීමේ මධ්‍යස්ථාන වසා තැබීම හේතුවෙනි.
5. ඇතැම් බුලත් පොළවල් වැනි දේශීය වෙළඳපලවල් සති ගණන් වසා තැබිණි.අපනයන කෘෂිකර්ම දෙපාර්තමේනතුවේ ආර්ථික පර්යේෂණ ඒකකයේ ප්‍රධාන කාර්ය භාර්ය වනුයේ අපනයන කෘෂි බෝගයන්හි ගොවිපල මිල සතිපතා එකතු කිරීම වේ. කොවිඩ් 19 වසංගතය හේතුවෙන් රට වසා තැබීම්, පළාත් අතර සංචරණය සීමා කිරීම් නිසා ක්ෂේත්‍ර නිලධාරින් හට වෙළඳපල දත්තයන්, මිල දී ගැනීමේ මධ්‍යස්ථානවලින් එකතු කිරීම කළ නොහැකි විය. රට වසා තැබීම් සහ පළාත් අතර සංචරණ සීමා පැනවීම නිසා ආර්ථික පර්යේෂණ ඒකකයේ , ක්ෂේත්‍ර සමීක්ෂණයන්හි නියැලෙන පර්යේෂණ නිලධාරින් හට එම කාර්යය ඉටු කිරීමේ දුෂ්කරතා පැන නැඟුණි.
6. ගම්මිරිස් වල ක්ෂණික මැලවීමේ රෝගය සහ කඳ විදින්නාගේ හානිය විශේෂයෙන්ම මොණරාගල සහ බදුල්ල යන දිස්ත්‍රික්ක වල පැතිරී ඇත. මෙය පාලනය කිරීම සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කීට විද්‍යාඥයින් , ව්‍යාධිවේදය පිළිබඳ විද්‍යාඥයින්, ක්ෂේත්‍ර නිලධාරින් එක්ව දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදි.
7. රජයේ හරිත කෘෂිකර්ම ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහා දෙපාර්තමේන්තුවේ රසායනික පොහොර නිර්දේශයන් කාබනික පොහොර භාවිතයෙන් නැවත ඇගයීමකට ලක් කරන ලදි.
8. කොවිඩ් 19 වසංගතය හේතුවෙන් පර්යේෂණ ක්ෂේත්‍රයන්හි අස්වනු නෙලීම්, දත්ත රැස් කිරීම් යනාදිය නියමිත කාල පරිච්ඡේදවල ඉටු කිරීම අපහසු විය. සහායක කාර්ය මණ්ඩලයේ හිඟතාවය, පර්යේෂණ කටයුතු වලදී අහිතකර ලෙස බලපෑවේය.

2.2.2. අනාගත ඉලක්ක / අරමුණු

- අපනයන ආදායම ඉහළ නැංවීම.

  2021 වසරේ දී අපනයන කෘෂි බෝග වලින් ලැබූ අපනයන ආදායම රුපියල් මිලියන 102,939.40 ක් වූ අතර එය පෙර වර්ෂයට වඩා ඉහළ අගයක් ගත් අතර, වසර 2025 වන විට අපනයන ආදායම රුපියල් බිලියන 150 ඉලක්කය සපුරා ගැනීමේ අරමුණ කරා යාම සඳහා පවතින වගා වපසරිය වැඩි කිරීම, ඒකකයකින් ලබා ගත හැකි අස්වැන්න වැඩි කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

- කාබනික භෝග වගාව ප්‍රචලිත කිරීම.

  රජය විසින් රසායනික පොහොර භාවිතය අවම කිරීම හා කාබනික පොහොර නිෂ්පාදනය කිරීම දිරි ගැන්වීම සඳහා ගනු ලැබූ තීරණය හේතුවෙන් වෙළඳපොළ තුල රසායනික පොහොර පැවැති හිඟතාවය හේතුවෙන් කාබනික වගාවන් කෙරෙහි ගොවීන් වඩාත් නැඹුරු විය. තවද,

කාබනික නිෂ්පාදන සඳහා වෙළඳපල පවතින ඉහළ මිල ගණන් හේතුවෙන් කාබනික බෝග නිෂ්පාදන ඉහළ නැංවීම හරහා ආර්ථික වාසි අත්කර ගැනීම අරමුණු කරගනිමින් කාබනික අපනයන කෘෂි බෝග වගා වපසරිය ඉහළ නැංවීම සඳහා වැඩි අවධානය යොමු කර ඇත. එහිදී දෙපාර්තමේන්තුව මඟින් කාබනික වගාව ප්‍රචලිත කිරීම හා දිරිගැන්වීමට අවශ්‍ය ව්‍යාප්ත වැඩසටහන් සඳහා ප්‍රතිපාදන ලැබීම අනිවාර්ය අවශ්‍යතාවයක් වේ.

- යහපත් නිෂ්පාදන පිළිවෙත් Good Manufacturing Practices (GMP) සහතිකකරණ ක්‍රියාවලිය , යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) වැඩසටහන සහ අපනයන කෘෂිබෝග පිරි සැකසුම් මධ්‍යස්ථාන ක්‍රියාත්මක කිරීම.

  ආර්ථිකව වැඩි විදේශ විනිමයක් ඉපයීම සඳහා අපනයන කෘෂිබෝග නිෂ්පාදනයන් , අගය එකතුකළ නිෂ්පාදන ලෙස දේශීය හා විදේශීය වෙළඳපලට ඉදිරිපත් කිරීම මඟින් වැඩි ආදායමක් ලබා ගැනීමට පවතින හැකියාව සැලකිල්ලට ගැනීම අත්‍යාවශ්‍ය වේ. යහපත් කෘෂි කාර්මික හා නිෂ්පාදන පිළිවෙත් ක්ෂේත්‍රයේ නිරත වගාකරුවන් හා නිෂ්පාදන කරුවන් අතර ප්‍රචලිත කරවීමට සැලසුම් කර ඇත. ඒ යටතේ උනන්දුව සහිත නිෂ්පාදකයන් ආකර්ෂණය කර ගැනීම හා නවීන තාක්ෂණයෙන් යුතු යන්ත්‍ර සූත්‍ර උපකරණ හා මෙවලම් හඳුන්වා දීම හා නියාමනය සඳහා දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම සිදු කිරීමට කටයුතු කරනු ඇත. මේ යටතේ වැඩි අපනයන කෘෂි බෝග නිෂ්පාදන ප්‍රමාණයක් විදේශ වෙළෙඳපලට ඉදිරිපත් කරමින් වැඩි විදේශ ආදායමක් ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.

- දේශගුණික විපර්යාස හා වන සත්ත්ව හානි වැළැක්වීම සඳහා අවශ්‍ය උපාංග හා මෙවලම් භාවිතය

  වර්තමානයේ දේශගුණිකව සිදුවන ජලගැලීම්, නියං තත්ත්ව වැනි කාලගුණික බලපෑම්වලින් අපනයන කෘෂි බෝග වගාවන් ආරක්ෂා කර ගැනීම සඳහා ක්ෂුද්‍ර ජල සම්පාදන භාවිතය ප්‍රචලිත කිරීම හා එයින් බෝග වගාවන්ට සිදුවන හානිය අවම කර උසස් ඵලදාව ලබා ගැනීමත් ඒ ආශ්‍රිත ඉලක්ක අත්පත්කර ගැනීම අපේක්ෂා කරනු ලැබේ. එහිදී අවශ්‍යතාව අනුව ක්ෂුද්‍ර වාරිමාර්ග පද්ධති ලබා දීම හා වන සත්ත්ව හානි වලින් වගාවන් ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍ය උපාංග ගොවීන් වෙත ලබා දීම සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදන දෙපාර්තමේන්තුව වෙත ලබා දීම අත්‍යාවශ්‍යම කරුණක්ව ඇත.

- අපනයන කෘෂි බෝග සඳහා කාබනික මොඩලයන් වැඩි දියුණු කිරීම රාජ්‍ය ප්‍රතිපත්ති වන හරිත කෘෂිකර්මය නිසා දෙපාර්තමේන්තුව අපනයන කෘෂිකර්ම බෝග සඳහා කාබනික පොහොර ඇගයීමක් කළ යුතු වේ.
- අපනයන කෘෂි භෝග වල රෝග හා පලිබෝධ පාලනය සඳහා රසායනික ද්‍රව්‍ය වලින් තොර පාලන ක්‍රම හඳුන්වා දීම කළ යුතු වේ.

- සම්ප්‍රදායික බඳුන් මාධ්‍යවල හිඟතාව නිසා අපනයන කෘෂි භෝග ගොවියන්ට පහසු නිර්දේශිත පැළ තවාන් මිශ්‍රණ හඳුන්වා දීම කළ යුතු වේ.
- ජාතික නිෂ්පාදනයේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක වැඩි වීමක් ලබා ගැනීම සඳහා අපනයන කෘෂි භෝග වල තෝරා ගන්නා ලද ජාන දර්ශ , නිර්දේශිත ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම උපායන් යටතේ බහු ස්ථානීය ඇගයීම් වලට ලක් කිරීමෙන් පසුව විශිෂ්ට වගා දර්ශ ලෙස ගොවීන් වෙත ලබා දිය හැකි වේ.
- ගම්මිරිස් වගාවේ ක්ෂණික මැළවීමේ රෝගය සහ කඳ විදින්නාගේ හානිය පාලනය සඳහා පර්යේෂණ වැඩි සංඛ්‍යාවක් කළ යුතු වේ .
- උසස් ගුණාත්මයෙන් රෝපණ ද්‍රව්‍ය ලබා දීම සඳහා මවු ශාක උද්‍යාන ඇති කිරීම.
- ඒක් ඒක් දිස්ත්‍රික්කවල භෝග පුරෝකථන දත්ත ඒකතු කිරීම විධිමත් කිරීම සඳහා වඩාත් විශ්වසනීය දත්ත සහ බිම් මට්ටමේ දත්ත ලබා ගැනීම සිදු කිරීම.
- අපනයන කෘෂි භෝග වල භෝග පුරෝකථන මොඩලයන් සඳහා ක්ෂේත්‍ර මට්ටමින් පර්යේෂණ සිදු කළ යුතු වේ .
- අපනයන කෘෂි භෝග මිළ දී ගැනීමේ මධ්‍යස්ථාන වලින් සතිපතා ගොවිපල මිළ ඒකතු කිරීමේදී ඒවා වඩාත් නිරවද්‍යතාවයෙන් ලබා ගැනීම.
- අපනයන කෘෂිකර්ම ක්ෂේත්‍රයේ වඩාත්ම අවධානය යොමු කළ යුතු අංශ පිළිබඳව පර්යේෂණ සිදු කිරීම.

.....

ඒ.පී.පී. දිස්නා

අධ්‍යක්ෂ ජනරාල්

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

ඒ.පී.පී. දිස්නා
අධ්‍යක්ෂ ජනරාල්
අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
1095, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත,
පේරාදෙණිය

පරිච්ඡේදය 03

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

2021-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ඒ.සී.ඒ -එෆ්

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

අයවැය 2021		සටහන	තත්‍ය 2021	2020	
-	ආදායම් ලැබීම්				
-	ආදායම් බදු	1			
-	දේශීය භාණ්ඩ හා සේවාමත බදු	2			ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මතබදු	3			
-	බදු නොවන ආදායම් හාවෙනත්	4			
-	මුළු ආදායම් ලැබීම් (අ)				
-	ආදායම් නොවන ලැබීම්				
1,536,516,000	භාණ්ඩාගාර අග්‍රිම		1,179,550,000	1,264,154,000	ඒසිඒ-3
4,000,000	තැන්පතු		4,864,487	1,241,836	ඒසිඒ-4
47,000,000	අත්තිකාරම් ගිණුම්		43,042,029	250,410,86.03	ඒසිඒ-5/5(ඒ)
	වෙනත් ලැබීම්				
1,587,516,000	මුළු ආදායම් නොවනලැබීම් (ආ)		1,227,456,516	1,290,436,922	
1,587,516,000	මුළු ආදායම් ලැබීම්සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		1,227,456,516	1,290,436,922	
68,309	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		1,927	3,001,089	
1,587,447,691	ශුද්ධ ආදායම් ලැබීම් ඉ=(අ)+(ආ)		1,227,454,589	1,287,435,833	
	අඩුකළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්				
660,500,000	වැටුප්, වේතනසහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	629,847,910	623,951,152	
71,900,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	71,209,393	67,901,012	ඒසිඒ-2(ii)
12,600,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	9,901,734	10,752,315	
	පොළී ගෙවීම්	8			
-	වෙනත් පුනරාවර්තනවියදම්	9	-		
745,000,000	මුළු පුනරාවර්තනවියදම් (ඊ)		710,959,037	702,604,479	
	මූලධන වියදම්				
14,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හාවැඩිදියුණු කිරීම්	10	12,590,281	8,910,086	
11,900,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	11,625,392	9,126,563	
700,000,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	360,697,382	528,269,650	ඒසිඒ-2(ii)
	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13			
2,100,000	හැකියා වර්ධනය	14	409,325	438,265	
12,150,000	වෙනත් මූලධන වියදම්	15	13,108,232	6,661,093	
740,150,000	මුළු මූලධන වියදම් (උ)		398,430,612	553,605,656	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)				
	තැන්පතු ගෙවීම් 14		3,303,161	1,989,038	ඒසිඒ-4
35,000,000	අත්තිකාරම් ගෙවීම් 15 වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම		51,433,938	25,329,758.24	ඒසිඒ-5/5(ඒ)
35,500,000	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)14+15		54,737,100	27,318,796	
1,520,150,000	මුළු වියදම් උ = (ඇ+ඉ+ඊ)		1,164,126,748	1,283,528,932	
	...2021..දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය= (ඇ-උ)		63,327,841	3,906,901	
	අග්‍රිම සැසැඳුම් ප්‍රකාශය අනුව ශේෂය		63,327,841	3,906,901	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය				ඒසිඒ-3
			63,327,841	3,906,901	

3.2 .මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

.....2021-12-31..... දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2021 රු.	2020 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	1,110,288,684	2,588,862,844
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	127,481,925	119,090,016
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3		
මුළු වත්කම්		**1,237,770,609**	**2,707,952,861**
ශුද්ධ වත්කම් /ස්කන්ධය			
ශුද්ධ වත්කම්		125,276,403	118,445,820
දේපළ පිරියත හා උපකරණ සංචිතය		1,110,288,684	2,588,862,844
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	2,205,522	644,196
අග්‍රිම ශේෂය	ඒසීඒ-3		
මුළු වගකීම්		**1,237,770,609**	**2,707,952,861**

පිටු අංක.....1....සිට ...52... දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍ර වලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන්පිටු අංක ...53.... සිට ...61.... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහි අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්ම වලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :	නම :	නම :
තනතුර :	තනතුර :	දිනය : 2022.
දිනය : 2022.05.09	දිනය :	

ඒ.පී.පී. දිස්නා
අධ්‍යක්ෂ ජනරාල්
අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
1095, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත,
පේරාදෙණිය

ඇල්.ඩී. අබේවික්‍රම
ප්‍රධාන ගණකාධිකාරි
අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
1095, ගැටබේ
පේරාදෙණිය

සමන් දර්ශන පාඩිකෝරාල
ලේකම්
උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැට්, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
16 වන මහල, "සුහුරුපාය", බත්තරමුල්ල.

3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

.....2021-12-31..... දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	2021	**2020**
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	
ලාභ	-	
ආදායම් නොවන ලැබීම්	1,887,618	6,999;546
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	42,968,775	36,989,161
අග්‍රිම ලැබීම	1,179,550,000	1,264,154,000
අත්තිකාරම් අයකර ගැනීම	1,103,318	1,853,615
තැන්පතු ලැබීම්	3,719,304	668,611
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**1,229,229,014**	**1,310,664,933**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	540,722,052	551,976,837
සහනාධාර සහ මාරුකිරීම්	6,896,502	1,162,071
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරණ ලද වියදම්	623,471,903	727,456,706
මූල්‍යපිරිවැය - භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	1,927	68,309
අත්තිකාරම් ගෙවීම්	46,705,708	18,966,777
තැන්පතු ගෙවීම්	3,305,186	1,907,670
මෙහෙයුම්ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**1,221,103,278**	**1,301,538,371**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**8,125,737**	**9,126,563**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී		
ලාභාංශ		
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම		
උපණය අයකර ගැනීම්		
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)		
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කරගැනීම්	8,125,737	9,126,563
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	8,125,737	9,126,563
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	(8,125,737)	(9,126,563)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල්ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**(0)**	**0**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්		
විදේශීය ණය ගැනීම්		
ප්‍රදානයන් ලැබීම්		
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)		
අඩුකළා : මුදල් වැය කිරීම්		
රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් ගෙවීම්		
තැන්පත් ගිණුම් ගෙවීම්		
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)		
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)		
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)	**(0)**	**0**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය		
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය		

3.4. මුල්‍ය ප්‍රකාශ සටහන්

2021 වසරට අදාලව මූල්‍ය ප්‍රකාශය සකසා විගණකාධිපති වෙත නියමිත දිනට ඉදිරිපත් කර ඇත.

3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු, 000

ආදායම් ක්ෙතය	ආදායම් ක්ෙතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව (රුපියල් මිලියන)	අවසන් ඇස්තමේන්තුව (රුපියල් මිලියන)	ප්‍රමාණය (රු.) (මිලියන)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2002-01-01	රජයේ ගොඩනැඟිලි කුලී	2.6	2.6	2.71	104.2
2002-02-99	ණය පොලිය - අනෙකුත්	5	5	5.14	102.8
2003-01-00	විකුණුම් සහ ගාස්තු - දෙපාර්තමේන්තු විකිණීම්	22	22	36.6	163.6
2003-02-99	විකුණුම් හා ගාස්තු- පරිපාලනාත්මක ගාස්තු හා ගෙවීම් - විවිධ	0	0	1.44	
2003-99-00	විකුණුම් හා ගාස්තු- අනෙකුත් ලැබීම්	12	5	7.8	156
2006-02-02	ප්‍රාග්ධන වත්කම් විකිණීම - වෙනත්	0.1	0.1	0.015	15

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු, 000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	745,000,000	745,000,000	710,959,037	95.43
ප්‍රාග්ධන	741,150,000	741,150,000	398,430,612	53.76

3.7. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු, 000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01.	උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්,කුරුඳු, කරාබු නැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි බෝග සංවර්ධනය ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	කුරුඳු පිරි සැකසුම් මධ්‍යස්ථාන හා කහ පැළ බෙදාදීම	179,751,394	179,751,394	715,780,22	39.8
02	උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්,කුරුඳු, කරාබු නැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි බෝග සංවර්ධනය ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	ඉඟුරු හා කහ පැළ බෙදා දීම	118,000,000	118,000,000	68,190,555	57.8
03	උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්,කුරුඳු, කරාබු නැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි බෝග සංවර්ධනය ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	ජල සම්පාදන පද්ධති ස්ථාපනය	30,000,008	30,000,008	10,773,487	35.9

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2021දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2021දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැඟිලි හා ව්‍යුහයන්	439,548,711.79	439,548,711.79	-	
9152	යන්ත්‍රෝපකරණ	27,198,054.84	27,621,236.84		
9153	ඉඩම්	346,845,556.30	350,213,860.12		
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

3.9. විගණකාධිපති වාර්තාව.



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } කේඩ්ඒ/සී/ඩීඊඒ/සී/2021/83 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2022 මැයි 31 දින.

07 JUN 2022

ගණන්දීමේ නිලධාරී,

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 31 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යය සාධනය හා මුදල් ප්‍රවාහය පොදුගව පිළිඟන් ජාතික විගණන මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වවාදාණතය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මගේ මතය තත්ත්වවාදාණතය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූලද ප්‍රකාශනේ පාඨකයන් විශේෂ වගකීම්, විගණනාධිපති වගකීම් යන විගණන්ගේ හැඳුරුම් වීස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මාවිසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශනය සුවිශේෂයෙන් ප්‍රකාශ ගණන්දීමේ නිලධාරීගේ හා ගණකාධිපතිගේ වගකීම්

පොදුගව පිළිඟන් නියෝගවල අනුකූලව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව මතය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කිරීම හා වංචා හෝ වැරදි නොමැතිවන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සංවේදී ප්‍රකාශොයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ක්‍රමෝපාය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සවිලදාගී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සෘතික විය යුතු අතර එම පද්ධතියේ ඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නියා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මතු රඟා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාර විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිත උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන් , වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල වසුනය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

1.6.1.1 මූල්‍ය තොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය අනුව දේපළ පිරියත හා උපකරණ ගිණුමේ ශේෂය රු.1,098,889,538 ක් වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ පසුගිය වර්ෂ තොරතුරු යටතේ එය රු.2,588,862,844 ක් ලෙස රු.1,489,973,306 ක් වැඩියෙන් දක්වා තිබුණි. එමෙන්ම එම අගයෙන්ම දේපළ පිරියත හා උපකරණ සංචිත අගයද වැඩියෙන් දක්වා තිබුණි.

ජාතික විගණන කාර්යාලය
NATIONAL AUDIT OFFICE

(ආ) ඉහත දැක්වෙන පරිදි ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙළ කර තිබුණු මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දේපළ පිරියත හා උපකරණ වටිනාකම රු.1,098,889,538 ක් වුවද එය සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරියට ගෙන ඒමේදී රු.1,102,130,963 ක් ලෙස සටහන් කර තිබුණු බැවින් සමාලෝචිත මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දේපළ පිරියත හා උපකරණ අගය රු.3,241,425 ක් වැඩියෙන් දක්වා තිබුණි. මෙයේ ගිණුම් තැබීම නිසා ගිණුම් තුලනය වූ ආකාරයද විගණනයට පැහැදිලි නොවිය.

1.6.1.2 තැන්පතු ගිණුම් ශේෂ

ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල තැන්පත් ගිණුම් පිළිබඳ ප්‍රකාශය අනුව කොන්ත්‍රාත් සඳහා වූ රැඳවුම් මුදල් ශේෂය රු.168,651 ක් වුවද එය සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරියට ගෙන ඒමේදී තැන්පත් ගිණුම් පිළිබඳ ප්‍රකාශයේ ආරම්භක ශේෂය රු.179,500 ක් ලෙස දක්වා තිබුණු බැවින් රු.10,849 ක වෙනසක් පැවතුණි.

1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ අග්‍රිම ලැබීම් රු.49,679,014 ක්ද තැන්පතු ලැබීම් රු.1,145,182 ක්ද අත්තිකාරම් ලැබීම් රු.41,938,711 ක්ද අඩුවෙන් දක්වා තිබුණු අතර වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් රු.468,061,621 ක් වැඩියෙන් දක්වා තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 බැරකම් හා බැඳීම්වලට එළඹීම

සමාලෝචිත වර්ෂයට අදාළ වියදම් සඳහා අවස්ථා 8 කදී, ඇති කරගත් බැඳීම් වෙනුවෙන් ගෙවිය යුතු රු.111,308 ක බැරකම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

5

2.2 නීති විරෝධී හා අරාජකතාවලින් අනුකූල නොවීම

පහත සඳහන් නීති විරෝධී හා අරාජකතාවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති විරෝධී ක්‍රියාවලියේ ස්වභාවය	වටිනාකම	අනුකූල නොවීම
	රු.	
(අ) 1992 අංක 46 දරන අපනයන සංවර්ධන අධිකාරී පනත		
(i) නියමයේදීය	602,900,000	අපනයන ප්‍රවර්ධන ආයතන පොදු සේවය පුන්චස් නිලධාරීන් සංවර්ධන ක්ෂේත්‍ර වශා කරන ගත සඟස් කරන නැතැත්තන්ට යහපාධාර සහ මිල්ලම්ය හෝ අනයාකාර වූ වෙනත් ආධාර ප්‍රදානය කිරීමේ යෝජනා ක්‍රම සඳහා අමාත්‍යාංශයේ විසින් නියෝග සංදහු ලැබීමෙන් පසුව පුවද එවැනි නියෝග සැදීමකින් තොරව අපනයන ප්‍රවර්ධන ආධාර ගෙවා තිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය		
XIV පරිච්ඡේදය 4.4 ඡේදය	44,100	ගේවා ශ්‍රීධාරයෙන් බැහැරව රාජකාරී සඳහා ගත කරන පැය 12 කට නොඅඩු කාල පරිච්ඡේදයක් සඳහා සම්පූර්ණ සංයුක්ත දීමනාවද පැය 6 කට නොඅඩු කාල පරිච්ඡේද සඳහා සංයුක්ත දීමනාවෙන් අඩක්ද ගෙවිය හැකි අතර පැය 6 කට අඩු කාල පරිච්ඡේදයන් සඳහා ගෙවිය නොහැකිය. එහෙත් එම විධිවිධාන නොසලකා සංයුක්ත දීමනා ගෙවා තිබුණි.

(ඇ)	2016 මාර්තු 17 දිනැති අංක 01/2016(1) දරන ජාතික අයවැය චක්‍රලේඛය	12,996,000	මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහන ලබා ගැනීමේදී අධ්‍යක්ෂ හා ඊට සමාන මට්ටමේ නිලධාරීන් සඳහා ලබා ගන්නා වාහනයක උපරිම මාසික බදු කුලිය (එකතු කළ අගය මත බදු රහිත) රු.135,000 ක් විය යුතු වුවද දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ඇතුලු අධ්‍යක්ෂවරුන් 08 දෙනෙකු සඳහා ලබාගෙන අනුයුක්ත කර තිබුණු වාහන සඳහා මසකට රු.163,500 බැගින් ගෙවා තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. කාර්යසාධනය

3.1.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් පරිදි වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙළ කළ යුතුව තිබුණු අතර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය අනුව එය වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. එහෙත් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව සතුව රජයේ නිවාස 90 ක් පැවති අතර ඉන් නිවාස 07 ක් අබලන් තත්ත්වයේ පැවතුණි. එමෙන්ම නිලධාරීන් පදිංචිනිවාස 32 ක් පැවති අතර එම නිවාස වැසි දිනවලදී ජලය කාන්දු වීම, වැසිකිළි කැඩී බිඳී තිබීම, විදුලිබලය නොතිබීම, ජලනල පද්ධතියේ ගැටලු පැවතීම සෑදී අඩුපාඩු පවතින බැවින් අලුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පැවතුණි.

(ආ) මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබාගත් වාහනවලට පදාළ ගිවිසුම් අනුව අමතර කුලියක් ගෙවීමෙන් තොරව මසකට කි.මී.3000 ක් ධාවනය කළ හැකිය. එහෙත් දෙපාර්තමේන්තුව විසින් එම පදනම යටතේ ලබාගත් වාහන 10 ක පසුගිය වසර 5 ක ධාවන තොරතුරු අනුව එම වාහන මාසිකව කි.මී.3000 දක්වා ධාවනය කර නොතිබුණු අතර ධාවනය කළ හැකිව තිබුණු එහෙත් ධාවනය නොකළ දුර කිමී.456827 ක් විය.

(ඇ) තක්සේරු වටිනාකම රු.3,000,000 ක් වූ වාහන 3 ක් වසර 5 කට අධික කාලයක් නිස්සේ භාවිතයෙන් තොරව පැවතුණි.

3.3. පාඩු හා හානි

පසුගිය වර්ෂවලදී සිදුව තිබුණු අලාභ හානි පිද්ධි 4 කට අයත් රු.3,926,808 ක අලාභ තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට තිබුණු අතර ඉන් රු.2,348,453 කට අදාළ පිද්ධි 2 ක් වසර 5 කට අධික කාලයක් පවතින ඒවා බව නිරීක්ෂණය විය.

3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගස්නාව පැළ තවාන 1982 වර්ෂයේ සිට බෝග වර්ග 20 කට ආසන්න ප්‍රමාණයක් මව් ශාක වශයෙන්ද, බීජ ලබා ගැනීම සඳහා ද පර්යේෂණ මට්ටමින්ද පවත්වාගෙන ගොස් නඩත්තු කර තිබුණු නමුත් පසුගිය වර්ෂ 5 ක කාලය තුළදී ගම්මිරිස්, කෝපි, කරාබු, පුවක් සහ සාදික්කා ආදී බෝගවලින් ලබාගන්නා වලදාව අඩුවෙමින් පැවතුණි. තවද ගස්නාව ප්‍රදේශයේ පිහිටි අපනයන බෝග පැළ තවානේ 1982 වර්ෂයේ සිට පවත්වාගෙන ගොස් තිබුණු වෘක්ෂලතා ලේඛනය 2011 වර්ෂයෙන් පසු යාවත්කාලීන කර නොතිබුණි. එමෙන්ම ගස් පිළිබඳ සංගණනයක් කර හෝ ගස්වලට අංකයොදා ලේබල් යොදා නොතිබුණි.

8

(ආ) ගත්තාව ඇළ ඉඩම්වලට 2018 දෙසැම්බර් මස ලැබී තිබුණු රොක්ෆොස්ෆේට්, කොළඹයිට ආදී රසායනික වර්ග 5 කට අයත් කිලෝග්‍රෑම් 2873 ක් 2021 දෙසැම්බර් වන විට ගබඩාවේ ගෙන්වාගත් අනෙක් වර්ග 3 කට අයත් කිලෝ ග්‍රෑම් 853 ක රසායනික වර්ග කල් ඉකුත් වී තිබුණි. එමෙන්ම නමම නොගෙ පිලදී ගෙන තිබුණු වවිනාකමද විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

4. තීරුසර සංවර්ධනය

තීරුසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම ඉඩම්කොමසාරිස්වරයාගේ දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වේ. [illegible] ආයතනය විසින් සිදු නොකළ බවත්, ඇතැම් ඉඩම් වල අයිතිය ගැටුම්කාරී වීම හේතුවෙන් ආගන්තුකයාට සඳහා ඉලක්ක පිළියෙළ කිරීමේදී සහභාගීත්ව ප්‍රවේශයක් භාවිත නොකළ බවත් නිරීක්ෂණය විය.

5. මූල්‍ය සම්පත් කළමනාකරණය

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට කාර්යමණ්ඩල විස්තර පහත දැක්වේ.

	මෙවා වර්ගය	අනුමත කාර්ය මණ්ඩලය	සැබෑ කාර්යය මණ්ඩලය	පුරප්පාඩු සංඛ්‍යාව
i.	පරිපාලන නිලධාරී	85	62	23
ii.	කෘෂිය නිලධාරී	29	9	20
iii.	ද්විතීය මට්ටම	800	645	155
iv.	ප්‍රාථමික මට්ටම	352	238	114
	එකතුව	1266	954	312

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජ්‍යෙෂ්ඨ මට්ටමේ පැවති පුරප්පාඩු 23 න් 16 ක් ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයට අයත් සහකාර අධ්‍යක්ෂ තනතුරු වූ අතර එය දෙපාර්තමේන්තුවේ කටයුතු සම්බන්ධයෙන් අහිතකර ලෙස බලයා තිබුණි.

(ආ) දිස්ත්‍රික් / විෂයානුබද්ධ ව්‍යාපෘති නිලධාරී තනතුරෙහි පුරප්පාඩු 16 ක් පැවති අතර එය ක්ෂේත්‍ර කටයුතු මනාලෙස පවත්වාගෙන යාමට බාධාවක්ව පැවතුණි.

(ඇ) පර්යේෂණ හා සංවර්ධන සහකාර තනතුරු 84 ක් අනුමත කර තිබුණු නමුත් එම තනතුරු සඳහා කිසිදු නිලධාරියෙකු බඳවාගෙන නොතිබුණි.

(ඈ) අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවන මුරකරු සහ කම්කරු සේවකයින් 114 දෙනෙකු සේවයේ යොදවා තිබුණු නමුත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් එම තනතුරු අනුමත කර නොතිබුණි.

ඒ.ජ.එම්.විජේරත්න
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත: අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය, කොළඹ 01.

10

පරිච්ඡේදය 04

කාර්ය සාධන දර්ශක

4.1.ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

4.1.1. අපනයන කෘෂි බෝග සංවර්ධන වැඩසටහන

2021 වසරේදී , අපනයන කෘෂි බෝග සංවර්ධන වැඩසටහන යටතේ මහා භාණ්ඩාගාරය මඟින් ලබා දුන් රු.මි.700.00 ක් හා අමාත්‍යාංශය මඟින් ලබා දුන් ප්‍රතිපාදන මඟින් අපනයන කෘෂි කලාප වැඩසටහන , කහ සහ ඉඟුරු වගා වැඩසටහන හා ක්ෂුද්‍ර ජල සම්පාදන ඒකක වැඩසටහන යන සංවර්ධන වැඩසටහන් 2021 වසරේදී දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාවට නංවන ලදි. මෙයට අමතරව අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ 432-2-3-7-2507 වැය විෂය මඟින් රුපියල් මිලියන 30.00ක ප්‍රතිපාදන ජල සම්පාදන පද්ධති ස්ථාපනය කිරීම සඳහා දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන ලදි. එම ප්‍රතිපාදන යටතේ ගස්නාව සහ මාතලේ මධ්‍යම පැළ තවාන්හි ජල මූලාශ්‍ර ස්ථාපිත කිරීම සහ නළ පද්ධති ස්ථාපිත කිරීම හා ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය අනෙකුත් මිල දී ගැනීම් අවසන් කරන ලදි. මාතලේ මධ්‍යම පර්යේෂණ මධ්‍යස්ථානයේ නළ ළිඳක් ඉදි කිරීමක්ද සිදු කරන ලදි.

වැඩසටහන	වෙන් කළ ප්‍රතිපාදන (රු.මි.)	ඉලක්ක
වගා වපසරිය ඉහල නැංවීමේ වැඩසටහන	405.7	• හෙක්ටයාර - 1690 • කුඩා පරිමාණ ගෙවතු පැළ 3,239,644 • ගෙවතු සඳහා පැළ 154,292 • පොකුරු ගම්මාන වැඩසටහනේ පොකුරු ගම්මාන 50 • කහ සහ ඉඟුරු ආයෝජන ආධාර වැඩසටහන - හෙක්ටයාර - 389 • පුවක් වගාව - පුවක් පැළ 1,112,000
මධ්‍යම පැළ තවාන් සංවර්ධනය	27.5	• පුවක් බීජ - 100,000 • සාදික්කා බීජ - 100,000 • බීජ මිලදී ගැනීම් • පොලි බෑග් සහ අනෙකුත් යෙදවුම් • බඳුන් මාධ්‍ය මිලදී ගැනීම් • ජල සම්පාදන පද්ධති සහ මවු ශාක උද්‍යාන පිහිටුවීම
අපනයන කෘෂිභෝග ඵලදායිතාව ඉහල නැංවීමේ වැඩසටහන	126.7	• පාළු පැළ ලබාදීම- හෙක්ටයාර - 2,580 • සත්ත්ව හානි වැලැක්වීම - ඒකක 90 • ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති - ඒකක 55 • අගය එකතු කිරීමේ වැඩසටහන
කාබනික ගම්මාන වැඩසටහන	82.0	• හෙක්ටයාර - 115 • පසු අස්වනු තාක්ෂණික උපකරණ - 600 • වෙළඳ ප්‍රවර්ධන වැඩසටහන් - 28 • මෘදුකාංග සංවර්ධනය - 25 • කාබනික සහතික - 05 • GMP / GAP / ISO / BRC - 10
ජනමාධ්‍ය සහ සන්නිවේදනය	32.1	• අත්පත්‍රිකා, පෝස්ටර් 300,000 • ප්‍රදර්ශන 05 • තොරතුරු සන්නිවේදනය 3,600
කුසලතා සංවර්ධනය	5.0	• ගොවි පුහුණු 1,115 • ක්ෂේත්‍ර දින 145 • නිලධාරි පුහුණු 22 • වැඩමුළු සම්මන්ත්‍රණ 11 • පුහුණු, මාතර කුරුඳු පර්යේෂණ මධ්‍යස්ථානය - 50
පරිපාලන වියදම්	21.0	
මුළු ප්‍රතිපාදන ප්‍රමාණය	**700.00**	

නව වගා සංවර්ධන වැඩසටහන කොළඹ, ගම්පහ, කළුතර, ගාල්ල,මාතර, හම්බන්තොට,මහනුවර, මාතලේ, නුවරඑළිය, කුරුණෑගල, කෑගල්ල, රත්නපුර, බදුල්ල, මොණරාගල, අනුරාධපුර සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්ක 17 තුළ 2021 වසරේදී ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, අපනයන කෘෂි බෝගයන්හි වගා වපසරිය වැඩි කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කරනු ලැබූ නව වගා සංවර්ධන වැඩසටහන යටතේ කුරුඳු, ගම්මිරිස්, සාදික්කා, කරාඹු, කොකෝවා, කෝපි, කරඳමුංගු, යන අපනයන කෘෂි බෝග වගා හෙක්ටයාර 1635.15 ක වගා වපසරියක් වගා කිරීමට හැකි විය.

ගෘහ පරිභෝජනය සඳහා අවශ්‍ය කුළුබඩු ගෙවත්ත තුළින්ම නිෂ්පාදනය කර ගැනීම, ගෙවත්ත තුල කුඩා පරිමාණ ආර්ථික වගාවන් ඇති කිරීම, මහා පරිමාණයෙන් වගා නොකෙරෙන අපනයන කෘෂිබෝග පොකුරු ගම්මාන ලෙස වගා කිරීම, ඉඩමේ ඵලදායිතාවය වැඩි කිරීම සඳහා අපනයන කෘෂිබෝග කුඩා පරිමාණ ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

ඉඩම් අක්කර 0.25 ට අඩු කුඩා ගෙවත්තකින් උපරිම ආර්ථික ප්‍රතිලාභ ලැබෙන මට්ටමට පත් කිරීම අරමුණු කර ගත් කුඩා ගෙවතු වැඩසටහන හා සෞභාග්‍යා ගෙවතු වැඩසටහන සඳහා පැළ ලබා දුන් අතර 3,108,129 ක් ද සෞභාග්‍යා ගෙවතු වගා වැඩසටහන යටතේ පැළ 120,541 ක් නොමිලයේ ලබා දෙන ලදී.

කුඩා ගෙවතු වැඩසටහන

බෝගය	ලබා දුන් පැළ ප්‍රමාණය
කුරුඳු	2,755,123
කරාඹු	1,820
කෝපි	4,238
ගම්මිරිස්	340,240
ගොරකා	1,950
සාදික්කා	4,758

සෞභාග්‍යා ගෙවතු වැඩසටහන

බෝගය	ලබා දුන් පැළ ප්‍රමාණය
කුරුඳු	2100
කරාඹු	06
කෝපි	25,776
ගම්මිරිස්	90,504
ගොරකා	2,134
සාදික්කා	1
පුවක්	20

පොකුරු ගම්මාන වැඩසටහන

මෙම වැඩසටහන යටතේ එක් ගම්මානයක් හෝ ගම්මාන කිහිපයක් ඒකාබද්ධ කොට පොකුරු ගම්මානයක් ලෙස, එක් පොකුරු ගම්මානයක් සඳහා අවම වශයෙන් සාමාජිකයින් 25ක් වත් සිටින සේ පොකුරු ගම්මාන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙහිදී, කණ්ඩායමක් ලෙස සංවිධානය කර පැළ නිකුත් කිරීමේ සිට අස්වනු අලෙවි කරන අවස්ථාව දක්වා ක්‍රමවත් සැලැස්මක් සකස්කර ගොවීන් සවිබල ගැන්වීමට සහ වෙළඳපල සම්බන්ධීකරණයට කටයුතු කරනු ලැබීය. මෙම පොකුරු ගම්මාන වැඩසටහන යටතේ ගම්මාන 98 ක් සඳහා අපනයන කෘෂි බෝග පැළ ලබා දෙන ලදී.

බෝගය	ලබා දුන් පැළ ප්‍රමාණය
කරඳමුංගු	12,400
වැනිලා	81,685
සාදික්කා	10,537

කහ,ඉඟුරු වගා සංවර්ධන වැඩසටහන

රජය විසින් කහ බෝගය ආනයනය කිරීම හා කහ වගා කිරීම සඳහා පැවති ඉල්ලුම ඉහල යාම හේතුවෙන් 2021 වර්ෂයේ අපනයන කෘෂි බෝග සංවර්ධන වැඩසටහන යටතේ කහ සහ ඉඟුරු වගා ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙහිදී ඉලක්ක ගත කහ වගා වපසරිය වැඩිකිරීමට කටයුතු කරන ලදී. මෙහිදී සක්‍රිය වගා වපසරිය උපරිම හෙ. 01 ක් දක්වා අවම කි.ග්‍රෑ. 10 සිට උපරිම කි.ග්‍රෑ. 300 දක්වා සපයාගනු ලබන ගුණාත්මක කහ බීජ අල කි.ග්‍රෑ. 01 කට රු. 150.00 බැගින් කහ වගාකරුවන් වෙත ආයෝජන ආධාර මුදල් ලබා දෙන ලදී. ඒ අනුව, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් සියළුම දිස්ත්‍රික්කයන් හි කහ හෙක්ටයාර 661.10 ක් වගා කරන ලදී.

ගෙවතු වගා සඳහා කහ පැළ ලබාදීමේ වැඩසටහනක් ද දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාවට නංවන ලද අතර, ගෘහස්ථ පරිභෝජනය සඳහා අවශ්‍ය කහ - ඉඟුරු අවශ්‍යතාවය තම ගෙවත්ත තුලින් නිෂ්පාදනය කිරීම හා නාගරික සහ අර්ධ නාගරික නිවෙස්වලට ප්‍රමුඛත්වය ලබාදෙමින් එක් ගෘහයක් සඳහා අවශ්‍යතාවය පරිදි කහ පැළ 05 ක උපරිමයක් දක්වාත් ඉඟුරු පැළ 05 ක උපරිමයක් දක්වාත් නොමිලේ නිකුත් කරන ලදී. ඒ අනුව, මෙම වැඩසටහන යටතේ කහ පැළ 5,222,527 ක් බෙදා දෙන ලදී.

අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ මඟින් ලබා දුන් ප්‍රතිපාදන යටතේ කහ සහ ඉඟුරු බීජ උද්‍යාන ස්ථාපනය කිරීමේ වැඩසටහනක් ද ක්‍රියාත්මක විය. උපරිම හෙක්ටයාර 01 ක් දක්වා අවශ්‍ය ගුණාත්මක කහ බීජ ප්‍රමාණය අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් අදාල ආයතන වෙත නොමිලේ සපයා දීමට කටයුතු කළ අතර, ඒවායේ තාක්ෂණික උපදෙස් සහ අධීක්ෂණ කටයුතු එම ආයතන වෙත ලබාදෙන ලදී. මෙම වැඩසටහන මඟින් ඉඟුරු සහ කහ බීජ ස්ථාපන වැඩසටහන, කහ සහ ඉඟුරු වගාකරුවන්ට අවශ්‍ය ගුණාත්මක කහ ඉඟුරු බීජ හිඟයකින් තොරව

සැපයීම අපේක්ෂා කරන ලද අතර, කහ වගාව රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනයන් හි ව්‍යාප්ත කර වීමට කටයුතු කරන ලදී.

2021 වසර තුලදී ද පුවක් වගා වැඩසටහන දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කරන ලද අතර පරිසර සංරක්ෂණය කිරීම අරමුණු කරන ලදී. මෙම පුවක් වගා ප්‍රවර්ධන වැඩසටහන යටතේ පුවක් පැළ 1,099,420 ක ප්‍රමාණයක් ගෙවතු ,රාජ්‍ය , පුද්ගලික ආයතන , වතු සමාගම් බෙදා දෙන ලදී.

උසස් ගුණාත්මයෙන් යුතු රෝපණ ද්‍රව්‍ය වගාකරුවන් වෙත සැපයීම අරමුණු කොට ගත් පැළ නිෂ්පාදන වැඩසටහන මෙම වැඩසටහන්වලට සමගාමීව ක්‍රියාත්මක කරන ලදි. දෙපාර්තමේන්තු වැඩසටහන් සඳහා අවශ්‍ය වාර්ෂික පැළ ප්‍රමාණයන් දෙපාර්තමේන්තුව මඟින් සෘජුවම පවත්වා ගෙන යන පැළ තවාන් 12ක් මඟින් හා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි පෞද්ගලික පැළ තවාන් මඟින් ලබා ගනී. යටිතල පහසුකම් අවශ්‍යතා සැපිරීම, රෝපණ ද්‍රව්‍ය හා රෝපණ මාධ්‍යය සැපයීම මෙන්ම වාර්ෂික පැළ අවශ්‍යතාවයන් සපුරාලීමට කටයුතු කරන අතර, පෞද්ගලික පැළ තවාන් 739 ක් වෙත අවශ්‍ය වන්නාවූ මහ පෙන්වීම පැළ නිෂ්පාදන වැඩසටහන යටතේ ක්‍රියාවට නංවන ලදි. 2021වර්ෂය තුළ දෙපාර්තමේන්තු පැළ තවාන් වල පැළ නිෂ්පාදනය පැළ මිලියන 17.49 ක් විය.

අපනයන කෘෂි බෝග වගාවන්ගෙන් උපරිම ඵලදාවක් ලබා ගැනීම සඳහා පවතින වගාවන්ගේ ඵලදායීතාවය ඉහළ නැංවීම අත්‍යාවශ්‍ය වේ. මෙම වැඩසටහන තුලින් වගා ඒකක භූමි ප්‍රමාණයකින් ලබා ගන්නා අස්වනු ප්‍රමාණය ඉහළ නැංවීම බලාපෙරොත්තු වේ. ඒ අනුව 2021 වසරේදී ඵලදායීතාවය ඉහළ නැංවීමේ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාවට නංවන ලද අතර, වගාව තුල පාළු සිටුවීමට අවශ්‍ය පැළ ලබා දෙන ලදි. ඒ අනුව පාළු පැළ සිටුවීමේ වැඩසටහන යටතේ හෙක්ටයාර 2291.17 ක වගාව ප්‍රතිස්ථාපනය කරන ලදි.

නිරන්තරයෙන් වගාවන්ට සිදුවන කාලගුණික වෙනස්කම් වලින් භෝගයන්ට වන හානිය වළකාලීම සඳහා හා වන සතුන්ගෙන් වගාවන්ට සිදුවන්නා වූ හානි වලින් වගාවන් ආරක්ෂා කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් 50% ක පිරිවැය දරමින් ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති ඒකක 56 ක් හා ආරක්ෂිත වැටවල් 80ක් ගොඩින් වෙත ලබා දෙන ලදි.

කාබනික ගම්මාන වැඩසටහන යටතේ කාබනික වගා හෙක්ටයාර 47.5 ක් අළුතින්ද 2020 වසරේදී ආරම්භ කරන ලද හෙක්ටයාර 59.8 ක් සඳහා දෙවන වාරික ගෙවීම් ද සිදු කරන ලදී. දැනටමත් ආරම්භ කර ඇති කාබනික ගම්මාන පිහිටුවා ඇති යටවත්ත, පුස්සැල්ල හා දිවුලපිටිය කාබනික ගොවි සංවිධාන 03 ක් සඳහා ජාත්‍යන්තරව පිළිගත් කාබනික සහතිකය ලබා ගැනීම වෙනුවෙන් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සිය තාක්ෂණික සහ මූල්‍යමය දායකත්වය ලබා දී ඇත. යහපත් කෘෂිකාර්මික පිළිවෙත් සඳහා වූ ප්‍රමිතීන් හා භාවිත සංග්‍රහයන් සකස් කර ඇති අතර, අයදුම්පත් 429 ක් සඳහා විගණන කටයුතු ආරම්භ කර ඇත. කාබනික සහතිකකරණ වැඩපිළිවෙල යටතේ අපනයන කෘෂි බෝග නිෂ්පාන ආයතන දෙකක් සඳහා HACCP, ISO 22000 සහ BRCGS සහතික ලබා දීම සඳහා අවශ්‍ය තාක්ෂණික හා මූල්‍යමය දායකත්වය සපයා දෙන ලදී. මීට අමතරව දේශීය හා විදේශීය ආයතන 11 ක් සමඟ කාබනික සහතික ලත් ගොවි සංවිධාන සමඟ අවශ්‍ය සම්බන්ධීකරණය හා පුද්ගල උපදේශන සේවා සැපයීම් 134 ක් සිදු කර ඇත.

දේශීය මෙන්ම ලෝක පරිමාණවද ශ්‍රී ලාංකීය කුළුබඩු සඳහා අනන්‍ය වූ පිළිගැනීම හේතුවෙන් එය වාසිදායක ලෙස භාවිතා කිරීමේ උපාය මාර්ගයක් ලෙස දැනට අළුතින් ජනිත වී ඇති වෙළඳපල අවස්ථාවන් උපරිමව භාවිතා කිරීම අත්‍යාවශ්‍ය වේ. ඒ මඟින් අපනයන පරිමාව ඉහළ නැංවීමත් ආදායම ඉහළ නැංවීම සඳහා උපාය මාර්ගයක් ලෙස අගය එකතු කිරීම හඳුනාගත් අතර ඒ යටතේ ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු නිෂ්පාදන වෙළඳපොලට හඳුන්වාදීම , ඒ සඳහා අන්තර්ජාතික පිළිගැනිමකින් යුත් තත්ත්ව සහතික ලබාදීම හා සහතිකකරණය යටතේ වූ කාබනික වගා ස්ථාපනය කිරීම සිදුකරන ලදි. පිරිසැකසුම් මධ්‍යස්ථාන හා පසු අස්වනු තාක්ෂණය ඉහළ ගුණාත්මක මට්ටමකින් තබා ගැනීම සඳහා යන්ත්‍ර සූත්‍ර ලබා දීම සිදු කරන ලදි.

පසු අස්වනු තාක්ෂණය සංවර්ධන වැඩසටහන

- පසු අස්වනු තාක්ෂණ ආයෝජන ආධාර ක්‍රමය යටතේ කුඩා හා මධ්‍ය පරිමාණ කුරුඳු පිරිසැකසුම් මධ්‍යස්ථාන 58 ක් , අනෙකුත් පිරිසැකසුම් මධ්‍යස්ථාන 04 සහ කේන්ද්‍රීය පිරිසැකසුම් මධ්‍යස්ථාන 09 ක් සඳහා ආයෝජන ආධාර ලබාදෙන ලදි. පසු අස්වනු තාක්ෂණය යාන්ත්‍රීකරණය තුළින් අස්වනු වල ඉහළ ගුණාත්මකභාවයක් ලබා ගැනීම හා මිනිස් ශ්‍රමය අවම ලෙස භාවිතය තුළින් නිෂ්පාදන වියදම අඩුකිරීම සඳහා හා යන්ත්‍රෝපකරණ 396 ක් හා කුරුඳු තෙල් නිස්සාරණ ඒකක 18 ක් සඳහා ආධාර ලබාදෙන ලදි.

උපකරණ වර්ගය	සංඛ්‍යාව
වියලන යන්ත්‍ර	47
ගම්මිරිස් බීජ වෙන් කරන යන්ත්‍ර	64
බ්ලාන්චර්ස්	03
සුදු ගම්මිරිස් නිෂ්පාදන යන්ත්‍ර	02
කුළුබඩු ඇඹරීමේ යන්ත්‍ර	11
කෝපි පොතු ගැලවීමේ යන්ත්‍රය	01
කෝපි බැදීමේ යන්ත්‍ර	01
කහ ස්ටීමරය	5
ඉහුරු/කහ පෙති කපන යන්ත්‍ර	13
කහ සේදීමේ යන්ත්‍ර	01
කහ පල්පරය	01
කහ පොලිෂර්	03
තෙතමන මීටරය	01
පොලිතීන් සීලර්	06
වියලන කමත්	05
කරුංකා ස්ලයිසර්	01
කරුංකා පොතු ඉවත් කිරීමේ යන්ත්‍ර	01
ගොරකා තෙත් ඇඹරීමේ යන්ත්‍ර	01
තණකොළ කැපීමේ යන්ත්‍ර	63
ඇලුමිනියම් ඉනිමග	161
වගා බිමේ පැළ සිටුවීම සඳහා වලවල් හාරන යන්ත්‍ර	04
ගම්මිරිස් සෙවණ කප්පාදු උපකරණ	01

- රට තුල පැවති කොරෝනා වසංගත තත්ත්වය හමුවේ බෝග වගාව හා බෝග වගා ආශ්‍රිත නිෂ්පාදනයන් පිළිබඳ ජනතා ආකර්ෂණය අඛණ්ඩව පවත්වාගෙන යාම සහ කෘෂි තාක්ෂණය ගොවීන් වෙත සම්ප්‍රේෂණය වීම අතිශයින් වැදගත් කරුණක් වේ. මේ සඳහා වෙළඳ ප්‍රවර්ධන

වැඩසටහන් හා ජනමාධ්‍ය වැඩසටහන් 2021 වසරේ දී පවත්වන ලදි. වාර්ෂිකව පැවැත්වෙන නැවුම් කුරුඳු මංගල්‍යය, අඛණ්ඩව සීමිත දෙපාර්තමේන්තු නිළධාරීන් හා කුරුඳු වගාකරුවන්ගේ සහභාගීත්වයෙන් ගාල්ල, සීනිගම දේවාල භූමියේදී උත්කර්ෂවත් ලෙස පවත්වන ලදි.

- අපනයන කෘෂි බෝග පිළිබඳ තාක්ෂණික දැනුම හා එම බෝගයන් වෙත ජනතාව වඩාත් ආකර්ෂණය කර ගැනීම සඳහා ජනමාධ්‍ය යොදා ගැනීම පහසු ක්‍රමයක් බැවින් දෙපාර්තමේන්තුවේ සියළුම පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් හා පර්යේෂණ හා තාක්ෂණික කරුණු ගොවි ජනතාව වෙත සන්නිවේදනය පහසු කිරීම සඳහා ජාතික රූපවාහිනිය ඔස්සේ ‘‘සැහවුණු කහවණු’’ නමින් වාර්තා වැඩසටහන් 23 ක් හා ‘‘රන්මසු උයන’’ නමින් වැඩසටහන් 23ක් ද විකාශනය කරන ලදි .ගුවන් විදුලි වැඩසටහන් යටතේ කඳුරට ,රුහුණු ,වෙළඳ ,රජරට හා වයඹ ගුවන් විදුලි සේවා ඔස්සේ ‘‘රස ජනනී’’ වැඩසටහන් 51ක් ද ස්වාධීන සේවය ඔස්සේ ‘‘හරිත මංසල’’වැඩසටහන් 16 ක් විකාශනය කරන ලදි .තවද අපනයන කෘෂි බෝග රූපවාහිනී දැන්වීම් 08 ක් විකාශනය කරන ලද අතර, පුවත්පත් දැන්වීම් 17 ක් ද සෑම සිකුරාදා දිනකම දිනමිණ පුවත්පතෙහි පළ කරන අපනයන කෘෂි බෝග මිල ගණන් 47 ක් , තාක්ෂණික පොත් 1477 ක් මුද්‍රණය කිරීම, පොස්ටර 304 ක් හා අපනයන කෘෂි බෝග අත්පත්‍රිකා 235,000 ක් මුද්‍රණය කරන ලදී. 1920 කෘෂි උපදේශන සේවාව ඔස්සේ අපනයන කෘෂි බෝග පිළිබඳ සේවා දායකයන් 5585 ක් සඳහා දුරකථනය ඔස්සේ උපදේශන සේවාවන් සපයන ලදි.

- මාතලේ පිහිටි සේවා සංස්කරණ පුහුණු මධ්‍යස්ථානය මගින් දෙපාර්තමේන්තු නිලධාරීන් 40 ක් හා දෙපාර්තමේන්තු නොවන වෙනත් නිලධාරීන් 151 ක් දෙනෙකු සඳහා අපනයන කෘෂි බෝග පිළිබඳ පුහුණු වැඩසටහන් පවත්වන ලදී. තවද පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් ජනතාව ඒකරාශී කිරීම අවම කිරීම හේතුවෙන් පුහුණු මධ්‍යස්ථානය මඟින් Zoom තාක්ෂණය ඔස්සේ මාර්ගගත ක්‍රමය මඟින් ‘‘කෘෂි තාක්ෂණික විද්වත් කතිකාවත්’’ නමින් දෙපාර්තමේන්තු හා දෙපාර්තමේන්තු සම්පත්දායක නිළධාරී මහත්ම මහත්මීන්ගේ දායකත්වයෙන් පුහුණු වැඩසටහන් මාලාවක් සතියේ සෑම සිකුරාදා දිනකම පෙ.ව. 10.00 සිට ප.ව.12.00 දක්වා පවත්වන ලද අතර, එහිදී ප්‍රතිලාභීන් 1250 ක් දෙනෙකු සඳහා අවශ්‍ය උපදේශන සේවාවන් සපයන ලදී.

  මාතර පිහිටි කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය මගින් කුරුඳු බෝගයේ යහපත් නිෂ්පාදන පිළිවෙත් පුහුණු වැඩසටහන් 02 ක්, යහපත් කෘෂිකාර්මික පිළිවෙත් ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන් 02 ක් හා අගය එකතු කිරීම පිළිබඳ පුහුණු වැඩසටහනක් 2021 වසරේදී පවත්වන ලද අතර එහිදී ප්‍රතිලාභීන් 117 ක් සඳහා අවශ්‍ය පුහුණු අවස්ථා සලසා දෙන ලදී.

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50%- 74%
වගා කරන ලද හෙක්ටයාර් ප්‍රමාණය	96.75	-	-
වගාව සඳහා නිකුත් කරන ලද පැළ සංඛ්‍යාව	100	-	-
සංවර්ධනය කරන ලද මධ්‍යම පැළ තවාන් සංඛ්‍යාව	100		-
පාළු පැළ සිටුවීම මඟින් ඵලදායිතාවය ඉහළ නංවන ලද ඉඩම් ප්‍රමාණය	-	88.8	-
ස්ථාපිත කරන ලද ක්ෂුද්‍ර ජලසම්පාදන පද්ධති ප්‍රමාණය	101	-	-
ස්ථාපිත කරන ලද සත්ව හානි වැටවල් ප්‍රමාණය	-	88.9	-
කාබනික අපනයන වගා හෙක්ටයාර ප්‍රමාණය	93.3		-
බෙදා හරින ලද පසු අස්වනු තාක්ෂණ උපකරණ ප්‍රමාණය	91	-	-
කුඩා පරිමාණ ගවෙතු	95		
ගෙවතු සඳහා පැළ			78
පොකුරු ගම්මාන වැඩසටහන	108		
කහ සහ ඉඟුරු ආයෝජන ආධාර වැඩසටහන			
පුවක් වගාව	98		
ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති	101		
පසු අස්වනු තාක්ෂණික උපකරණ			80
මුද්‍රිත මාධ්‍ය	100		
අත්පත්‍රිකා, පෝස්ටර්			78
තොරතුරු සන්නිවේදනය	155		

- අපනයන කෘෂි භෝග පර්යේෂණ සහ ඒකාබද්ධ රෝග සහ පළිබෝධ පාලන වැඩසටහන මඟින් අවධාරණය කරනු ලබන්නේ අපනයන කෘෂි භෝග මඟින් උපරිම නිෂ්පාදනයක් සහ උසස් ගුණාත්මයන් ලබා ගැනීම වේ. මෙම ඉලක්ක අත්පත් කර ගැනීම පර්යේෂණ මධ්‍යස්ථාන 08 ක් මඟින් සිදු කරනු ලබයි.
- 2021 වර්ෂයේ දී කොවිඩ් 19 වසංගත තත්ත්වය යටතේ වුව ද පර්යේෂණ 154 ක් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් කරගෙන යන ලදි. මෙම පර්යේෂණ අතරින් පර්යේෂණ වැඩිම සංඛ්‍යාවක් එනම් පර්යේෂණ 42 ක් පදනම් වනුයේ කුරුඳු බෝගය මත වන අතර දෙවනුවට වැඩිම පර්යේෂණ සංඛ්‍යාවක් එනම් පර්යේෂණ 28 ක් පදනම් වනුයේ ගම්මිරිස් බෝගය මත වේ. අනෙක් පර්යේෂණ වැඩසටහන් ඉලක්ක ගත වනුයේ කෝපි, කරඳමුංගු , සාදික්කා, ඉඟුරු, කහ, බුලත්, ගොරකා , කොකෝවා, වැනිලා , කරාඹු නැටි සහ පුවක් යන බෝග සම්බන්ධව වේ.
- මෙම පර්යේෂණ වැඩසටහන් මඟින් අවධාරණය කරනුයේ භෝග වැඩි දියුණු කිරීම සහ ජාන දර්ශ සංරක්ෂණය , භෝග කළමණාකරණය සහ ස්වභාවික සම්පත් කළමණාකරණය යන ක්‍රියාමාර්ග තුළින් නිෂ්පාදකතාවය වැඩිදියුණු කිරීම ජෛවීය හා ජෛවීය නොවන

ක්‍රියාකාරකම් වලින් ඇතිවන පීඩනයන්ගෙන් ශාක ආරක්ෂණ ක්‍රියාවලිය ගුණාත්මය වැඩි දියුණු කිරීම සහ අගය ඒකතු කිරීම සඳහා පසු අස්වනු තාක්ෂණයන් ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය අපනයන කෘෂි භෝගයන්ට දේශගුණික විපර්යාස නිසා ඇතිවන බලපෑම අවම කිරීම ,අපනයන කෘෂි භෝග සාම්ප්‍රදායිකව වගා නොකරන ප්‍රදේශ වලට ඒම භෝග අනුවර්තනය කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම , නව කෘෂි භෝග පද්ධති හඳුන්වා දීම , සමාජ ආර්ථික හා වෙළඳපොළ තත්ත්වය පිළිබඳව දැනුවත්භාවය වැඩි දියුණු කිරීම සහ තාක්ෂණික සේවාවන් හා දැනුම බෙදා හැරීම යනාදියයි.

- අපනයන කෘෂි බෝග බහු වාර්ෂික බැවින් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බොහෝ පර්යේෂණ වැඩසටහන් දිගු කාලීන වන අතර පර්යේෂණ අඩු සංඛ්‍යාවක් කෙටි කාලීන පර්යේෂණ වැඩසටහන් වේ. දිගු කාලීන පර්යේෂණ වැඩසටහන් වල අවසන් ප්‍රතිඵලයක් ලබා ගැනීම සඳහා දීර්ඝ කාලයක් ගත වන නමුදු කෙටි කාලීන පර්යේෂණ වැඩසටහන් වල ප්‍රතිඵලයක් ලබා ගැනීම සඳහා ගත වන්නේ වර්ෂයක් හෝ දෙකක් වැනි කාලයක් වේ.

පහත දැක්වෙන්නේ පර්යේෂණ වලින් ලබා ගත් ප්‍රධාන පර්යේෂණ ප්‍රතිඵල කිහිපයක් වේ.

- කුරුඳු බීජ පැළ සඳහා පැළ තවාන් බඳුනක් ලෙස මී.මී 120* 60 ප්‍රමාණයේ කොහුබත් පිඩලි බඳුන් මාධ්‍යය විකල්ප මාධ්‍යක් ලෙසට නිර්දේශ කළ හැකිය.
- ශ්‍රී විජය (අවුරුද්දකට හෙක්ටයාරයකට 1476 kg) සහ ශ්‍රී ගැමුණු (අවුරුද්දකට හෙක්ටයාරයකට 1403.5 kg) ප්‍රභේද වල බීජ පැළ ශාක පවා (F1 පරම්පරාව) සාමාන්‍ය කුරුඳු වලට වඩා වැඩි අස්වැන්නක්ලබා දුනි. (අවුරුද්දකට හෙක්ටයාරයකට 1039.1 kg)
- කුරුඳු ශාකයේ ඇති වන කැන්කර් වල කැන්කර් ඇති වන ස්ථානයේ ඝනකම කඳේ මේරීමත් සමඟම වැඩි වේ. අධි වර්ධනය වූ කුරුඳු කඳන් ඇති විට ඊට සමානුපාතිකව කැන්කර් ඇති ස්ථානයේ පොත්තට වන හානියද තීව්‍ර වේ.
- කුරුඳු කොළ අංගමාරයට හේතු වන රෝග කාරකය හඳුනා ගන්නා ලදී .
- පටක රෝපිත කහ පැළ නිෂ්පාදනය ආරම්භ කරන ලදී.
- පටක රෝපණයෙන් කුරුඳු පැළ නිෂ්පාදනය කිරීම සඳහා කුරුඳු පටක රෝපණ මාධ්‍යයේ ස්ථාපිත වීම සහ මුල් ඇති වීම සාර්ථකව සිදු කරන ලදී.
- ශ්‍රී ලංකාවේ කුරුඳු වගාවට සහ පැළ තවාන් වලට අළුතින්ම ඒක් වූ පලිබෝධකයෙක් වූ කුරුඳු පැළ මැක්කා හඳුනා ගැනීම සහ වර්ගීකරණය කිරීම සිදු කරන ලදී.
- හරිත කෘෂිකර්මය රාජ්‍ය ප්‍රතිපත්තියක් වන බැවින් කුරුඳු පැළ තවාන් වල රෝග හා පලිබෝධ පාලනය සඳහා කාබනික නිස්සාරක ඇගයීමට බඳුන් කරන ලදී.
- කුරුඳු කඳන් විදින සලඹයා පාලනය සඳහා මැටි අඩංගු මිශ්‍රණයන් භාවිතා කරන ලදී.
- පර්යේෂණ මධ්‍යස්ථාන මඟින් පර්යේෂණ සිදු කිරීම හැරුණු කොට ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය වන ගම්මිරිස් පැළ, කහ රෙසෝම , පටක රෝපිත පැළ , කොපි බීජ , බීජ ප්‍රතිකාර කරන ලද

කරඳමුංගු බීජ, කරඳමුංගු බීජ පැළ , කරඳමුංගු මොරෙයියන් , සාදික්කා බීජ පැළ , සාදික්කා බද්ධ පැළ, පුවක් බීජ, කොකෝවා බීජ පැළ, ගොරකා බද්ධ පැළ, කුරුඳු බීජ පැළ , කුරුඳු අතු පැළ, බුලත් දඬු සහ බුලත් බඳුන් ගත කරන ලද පැළ ලබා දීම ද සිදු කරන ලදි. උසස් ගුණාත්මයෙන් යුත් රෝපණ ද්‍රව්‍ය මඟින් අපනයන කෘෂි බෝග වල නිෂ්පාදනය වැඩි දියුණු කරයි.

- අපනයන කෘෂි භෝග පිළිබඳව නවීන දැනුම අවශ්‍ය කරන පුද්ගලයන් හට ලබා දීමෙන් දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළට අවශ්‍ය වන ගුණාත්මක භාවයෙන් යුත් නිෂ්පාදන ලබා දිය හැකි වේ. ජන මාධ්‍යක් වන රූපවාහිනී වැඩසටහන් (“රන්මසු උයන”, “සැහවුණු කහවණු”, “භෝග සායනය”)ගුවන් විදුලි වැඩසටහන් (“රස ජනනී”, “හරිත මංසල”, “සජීවී කෘෂිකාර්මික වැඩසටහන්”) වෙබ් අඩවි සහ පුවත් පත් ලිපි මඟින් දැනුම ලබා දීම සිදු කරන ලදි.
- අපනයන කෘෂි භෝග වලට අදාළව විවිධ විෂයන් සම්බන්ධයෙන් පුහුණු පංති පැවැත්වීමෙන් දැනුම අවශ්‍ය වන පුද්ගලයින් පර්යේෂණ මධ්‍යස්ථාන කරා පැමිණ අවශ්‍ය තොරතුරු ලබා ගැනීමෙන් දුරකථනයෙන් ගැටළු විමසීමෙන් යන ආකාර වලින් ද නවීන තාක්ෂණය ලබා දීම සිදු කරන ලදි.
- සහතික පත් පාඨමාලාවල ශිෂ්‍යයන්, ඩිප්ලෝමා පාඨමාලාවල ශිෂ්‍යයන්, උසස් ඩිප්ලෝමා පාඨමාලාවල ශිෂ්‍යයන්, විශ්ව විද්‍යාලවල උපාධි අපේක්ෂකයන් යන අය පුහුණු කිරීම ද පර්යේෂණ මධ්‍යස්ථාන මඟින් සිදු කරන ලදි. මෙමඟින් ඔවුන්ගේ ක්ෂේත්‍ර කටයුතු හා පර්යේෂණාගාර වල පුහුණු කටයුතු දියුණු කිරීම කරන ලදි. විශ්ව විද්‍යාල වල උපාධි අපේක්ෂකයන් හා පශ්චාත් උපාධි අපේක්ෂකයින්ගේ පර්යේෂණවල අධීක්ෂණ කටයුතු කිරීම ද සිදු කරන ලදි.
- කාබනික පොහොර පර්යේෂණාගාරවල පරීක්ෂා කිරීම ඇතුළුව පස් සාම්පල, පටක සාම්පල, ගම්මිරිස් සාම්පල, සහ සාම්පල පරීක්ෂා කිරීම සිදු කරන ලදි. කාබනික පොහොර සඳහා ක්ෂේත්‍ර පරීක්ෂාව, කාබනික ද්‍රව්‍ය යොදා රෝග හා පළිබෝධ පාලනය කිරීම, වල් පැළෑටි පාලනය කිරීම සඳහා රසායනික නොවන ද්‍රව්‍ය වල ක්ෂේත්‍ර පරීක්ෂාවන් ද සිදු කරන ලදි.
- පොහොර උපදේශන කමිටුව, ජාතික කාබනික පාලන ඒකකය, පරිසර අමාත්‍යාංශයේ කාබනික කෘෂිකර්ම ජාතික කමිටුව වැනි ජාතික මට්ටමේ වැඩමුළු සහ කමිටු වලට දායකත්වය ලබා දීම නිලධාරීන් විසින් ඉටු කරන ලදි.

පැළෑටි සංරක්ෂණ ඒකකයේ කාර්ය භාරය පහත පරිදිවිය.

- පුහුණු පංති 10 ක් පැවැත්වීම, ක්ෂේත්‍ර දින 06 ක් පැවැත්වීම , ක්ෂේත්‍ර චාරිකා 18 ක් පැවැත් වීම මඟින් පැළෑටි සංරක්ෂණයට අදාල ගැටළු සඳහා උචිත විසඳුම් ලබාදෙන ලදි. මෙම පුහුණු

පංති , ක්ෂේත්‍ර දින, ක්ෂේත්‍ර චාරිකා සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සංවර්ධන අංශයේ ඒකාබද්ධ දායකත්වය ද ලබා ගන්නා ලදි.

- බදුල්ල සහ මොණරාගල දිස්ත්‍රික්ක වල ගම්මිරිස් ක්ෂණික මැලවීමේ රෝගය සහ කඳ විදින්නා පාලනය සඳහා තාක්ෂණික උපදේශනය සැපයීම, රෝගී සාම්පල විශ්ලේෂණය (පාංශු සාම්පල 80ක්) රුපියල් 10,626,000.00 ක් වටිනා නිර්දේශිත දිලීර නාශක සහ කෘමි නාශක ද වාණිජ නිෂ්පාදනයක් ලෙස Trichoderma විශේෂ වගා කරන ලද ටැල්ක් මාධ්‍යය 10 kg සැපයීම කරන ලදි.
- මහනුවර , කුරුණෑගල, මාතලේ සහ කෑගල්ල යන දිස්ත්‍රික්ක වල සාදික්කා පත්‍ර පතන රෝගය පාලනය සඳහා තාක්ෂණික උපදේශන සේවා ලබා දීම සහ අධික්ෂන කටයුතු කිරීම සිදු කරන ලදි. කහ, පුවක් සහ එනසාල්වල රඳවා තබා ගන්නා ලද සහ හොර රහසේ ප්‍රවාහනය කරන ලද තොග පරීක්ෂා කර බලා ඒ පිළිබඳ වාර්තා 35 ක් ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා පොලිසිය කුළුබඩු සහ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය වෙත ලබා දෙන ලදි.
- පැන නගින ලද ශාක සංරක්ෂණ ගැටළු 1000කට අධික ප්‍රමාණයකට සුදුසු විසඳුම් දුරකථනය මඟින් සහ 1920 “ ගොවි සහන සරණ සේවය” මඟින් ලබා දෙන ලදි.

4.1.2. ගොඩනැඟිලි ඉදිකිරීම් , අළුත්වැඩියා, ඉඩම් සංවර්ධනය හා යටිතල පහසුකම්

අපනයන කෘෂි බෝග සංවර්ධන වැඩසටහන හා අපනයන කෘෂි බෝග පර්යේෂණ සහ ඒකාබද්ධ රෝග හා පළිබෝධ කළමණාකරණ (IPM) වැඩසටහන යන වැඩසටහන් 02 යටතේ ගොඩනැඟිලි අළුත්වැඩියා, නව ඉදිකිරීම් ,ඉඩම් හා ඉඩම් සංවර්ධනය හා යටිතල පහසුකම් සංවර්ධනය යටතේ රුපියල් මිලියන 17.01 ක ප්‍රතිපාදන 2021 වසර සඳහා වෙන් වූ අතර නියමිත වසර තුළම වියදම් කිරීමට යටත්ව සියළුම ඉදිකිරීම් හා අළුත්වැඩියා ඉඩම් සංවර්ධන හි යටිතල පහසුකම් ව්‍යාපෘති ක්‍රියාත්මක කර භෞතිකව හා මූල්‍ය වශයෙන් 100% ප්‍රගතියක් ලබා කර ගැනීම සඳහා විශේෂ අවධානයක් හා මැදිහත්වීමක් සහිතව කටයුතු කිරීමට සිදු විය. 2021 වර්ෂය සඳහා වෙන් වූ සියළු ප්‍රතිපාදන යොදවා සැලසුම් කළ සියළු ව්‍යාපෘතීන් භෞතික හා මූල්‍ය වශයෙන් 100% ප්‍රගතිය කරා ළඟා වීමට හැකිවිය.

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50%- 74%
ගොඩනැඟිලි අළුත්වැඩියාවන් සම්පූර්ණ කළ ප්‍රමාණය	100		
නව ගොඩනැඟිලි ඉදි කළ ප්‍රමාණය	100		
ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මඟින් සංවර්ධනය කරන ලද ඉඩම් ප්‍රමාණය	100		
සම්පූර්ණ කරන ලද යටිතල පහසුකම් ව්‍යාපෘති ප්‍රමාණය	100		

පරිච්ඡේදය 05

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1. දෙපාර්තමේන්තුවට අදාලව හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු.

ඉලක්ක අංක 01:- සෑමතැනම සෑම ආකාරයකම දරිද්‍රතාවය අවසන් කිරීම.

1.4. වර්ෂ 2030 පමණ වන විට සියළුම, විශේෂයෙන්ම දිළිඳු හා අවදානමට ලක්විය හැකි පුරුෂයින් හා ස්ත්‍රීන් හට ආර්ථික සම්පත් වලට සමාන අයිතිවාසිකම් මෙන්ම මූලික සේවාවන්ට ප්‍රවේශය ද , භූමිය හා වෙනත් ආකාරයේ දේපළ , උරුමය, ස්වභාවික සම්පත් අයිතිකාරීත්වය හා පාලනය ද ක්ෂුද්‍ර මූල්‍ය ද ඇතුළුව නවීන තාක්ෂණය හා මූල්‍ය සේවා භාවිතයට ගැනීමට ඇති හැකියාව ද සහතික කළ යුතුය. මේ යටතේ එතෙක් 50% ක පිරිවැය දරා රෝපණ ද්‍රව්‍ය සපයා ක්‍රියාත්මක කළ වගා ව්‍යාපෘති මෙම වර්ෂය තුළ 100% ගොවීන් වෙත ලබා දී වගාව සඳහා ගොවීන් දිරිගැන්වූ අතර ඒ තුළින් ස්ව නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කිරීමට හැකිවිය.

1.b. දරිද්‍රතාවය මූලෝත්ගමනය කිරීමේ ක්‍රියාමාර්ග සඳහා වූ වේගවත් ආයෝජනයන්ට ආධාර කිරීමට දිළිඳු ජනතාව හා ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වූ සංවර්ධන උපාය මාර්ග මූලික කොටගත් ප්‍රතිපත්ති රාමුවක් ජාතික , ප්‍රාදේශිය සහ ජාත්‍යන්තර මට්ටම්වලින් නිර්මාණය කිරීම ඊට අනුගත වෙමින් කුඩා පරිමාණව හෝ වගාව සඳහා මහ ජනතාව යොමු කිරීම සඳහා කුඩා පරිමාණ ගෙවතු වගා වැඩසටහන් ක්‍රියාවට නංවන ලදි.

ඉලක්ක අංක 02:- කුසගින්න අවසන් කිරීම, අහාර සුරක්ෂිතතාවය හා පෝෂණය ඉහළ නැංවීම සාක්ෂාත් කර ගැනීම හා තිරසාර කෘෂිකර්මාන්තය ඉහළ නැංවීම, පාංශු සංරක්ෂණ ක්‍රම භාවිතය, දේශගුණික වෙනස්කම් සඳහා ඔරොත්තු දෙන කෘෂි තාක්ෂණය භාවිතයට සහභාගී වීම, කාබනික වගාව ප්‍රචලිත කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාවට නංවන ලදි.

2.3. භූමිය සඳහා ආරක්ෂිත හා සමාන ප්‍රවේශය, වෙනත් නිෂ්පාදන සම්පත් හා යෙදවුම්, දැනුම, මූල්‍ය සේවා, වෙළඳපල අගය එකතු කිරීම සහ නොයෙක් රැකියා සඳහා අවස්ථා ඇති කිරීම තුළින් විශේෂයෙන්ම කාන්තාවන්, ස්වදේශිය ජනතාව, ගොවියන්, පශු කර්මාන්තකරුවන් සහ ධීවරයින්ගේ කෘෂිකාර්මික ඵලදායිතාව සහ කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ ආදායම වර්ෂ 2030 පමණ වන විට දෙගුණ කිරීම, පුහුණු වැඩසටහන්, ක්ෂේත්‍ර නිරීක්ෂණ, හා අනෙකුත් ඵලදායීතා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාවට නංවන ලදි.

2.4. ඵලදායිතාවය හා නිෂ්පාදනය ඉහළ නංවන පරිසර පද්ධති ආරක්ෂා කර ගැනීමට උනන්දු වන , දේශගුණික වෙනස් වීම්, අන්තගාමී දේශගුණය, නියං, ජල ගැලීම්,සහ වෙනත් ව්‍යසනයන්ට අනුවර්තනය වීමේ හැකියාව ශක්තිමත් කරන භූමි සහ පාංශු ගුණාත්මක බව වඩ වඩා ඉහළ නංවන

ප්‍රත්‍යාස්ථ කෘෂිකාර්මික පුරුදු ක්‍රියාවන්ට නැංවීම හා තිරසාර ආහාර නිෂ්පාදන පද්ධතීන් වර්ෂ 2030 පමණ වන විට ඇති කරන බවට සහතික කළ යුතුය.

2.5. 2020 වන විට ජාතික, ප්‍රාදේශීය සහ අන්තර්ජාතික මට්ටම්වලින් මනාව කළමණාකරණය කරනු ලබන සහ විවිධාංගීකරණයට ලක් කරන ලද බීජ සහ පැළෑටි බැංකු පිහිටුවීම තුළින් බීජවල සහ ගොවිපළගත හීලෑ කරන ලද සතුන් සහ ඔවුන්ටඥාති සම්බන්ධතා දක්වන සතුන් වර්ගවල ජානමය විවිධත්වය පවත්වා ගෙන යාම සහ අන්තර්ජාතික ගිවිසුම් වලට අනුකූලව ජානමය සම්පත් හා ආශ්‍රිත සම්ප්‍රදායික දැනුම භාවිතාව තුළින් ජනනය වන ප්‍රතිලාභ සාධාරණව සහ සමානව බෙදා හදා ගැනීමකට ඇති ප්‍රවේශය පුළුල් කිරීම.

2.a. වැඩි අන්තර්ජාතික සහයෝගීතාව තුළින්, ඌන සංවර්ධිත රටවල් ද ඇතුළත්ව , සංවර්ධනය වෙමින් පවතින රටවල කෘෂිකාර්මික ඵලදායිතා ධාරිතාව ඉහළ නැංවීම සඳහා ග්‍රාමීය යටිතල පහසුකම්, කෘෂිකාර්මික පර්යේෂණ සහ ව්‍යාප්ත සේවා , තාක්ෂණවේදය සංවර්ධනය කිරීම සහ පැළෑටි සහ පශු සම්පත් ජාන බැංකුවල ආයෝජනය වැඩි කිරීම.

ඉලක්ක 04:- සියළු දෙනාටම සාධාරණාත්මක හා ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සියල්ලන්ටම යාවජීව අධ්‍යාපන අවස්ථා ඉහළ නැංවීම.

4.3. වර්ෂ 2030 පමණ වන විට සියළුම කාන්තා හා පුරුෂ පාර්ශවයන්ට විශ්ව විද්‍යාල ද ඇතුළත්ව දැරිය හැකි හා ගුණාත්මක බවින් යුතු තාක්ෂණික වෘත්තීය හා තෘතියික අධ්‍යාපනය සඳහා සමාන ප්‍රවේශ අවස්ථා සහතික කිරීම.

4.7. තිරසාර සංවර්ධනය සහ තිරසාර ජීවන ක්‍රම, මානව හිමිකම්, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, ප්‍රචණ්ඩත්වයෙන් තොර සාමකාමී සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභාවය හා සංස්කෘතික විවිධත්වය අගය කිරීම, තිරසාර සංවර්ධනය සඳහා සංස්කෘතියේ දායකත්වය ආදි කරුණු තුළින් වර්ෂ 2030 පමණ වන විට සියළුම ආධුනිකයන් විසින් තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය දැනුම සහ නිපුණතාවයන් අත් කර ගෙන ඇති බවට සහතික කළ යුතුය.

ඉලක්ක 17:- තිරසර සංවර්ධනය සඳහා වන ගෝලීය සහභාගීත්වය ක්‍රියාවට නැංවීම හා යළි නහා සිටුවීම ශක්තිමත් කිරීම

17.11.2020 දී අඩු දියුණු රටවල ගෝලීය අපනයන කොටස් දෙගුණ කිරීම ඇතුළත්ව සංවර්ධනය වන රටවල අපනයනය කැපී පෙනෙන ලෙස වර්ධනය කිරීම.

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ආහාර සුරක්ෂිතතාව ඇති කිරීමේ තිරසර සංවර්ධන ඉලක්කය සපුරා ගැනීම සඳහා වසර පුරා රට තුල පැවැති කොරෝනා වසංගත තත්ත්වය හමුවේ වුවද අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් 2021 වසර තුලදී විවිධ සංවර්ධන වැඩසටහන් ක්‍රියාවට නංවන ලදී. මෙම සංවර්ධන වැඩසටහන් ක්‍රියාවට නැංවීම තුලින් ඒ සඳහා උනන්දුවක් දක්වන පාර්ශවකරුවන් අපනයන කෘෂි බෝග ක්ෂේත්‍රය කෙරෙහි ආකර්ෂණය කර ගැනීම , වගා වපසරිය ඉහළ නැංවීම මෙන්ම අපනයන භෝග ක්ෂේත්‍රයේ නිරත සියළු පාර්ශවකරුවන්ගේ ආදායම් ඉහළ නැංවීම ඉලක්ක කරන ලදී. ඒ අනුව, අපනයන කෘෂි බෝග නව වගා වපසරිය හෙක්ටයාර 1635.15ක ප්‍රමාණයක් නව වගාවන් ලෙස ආරම්භ කරන ලද අතර.ඒ සඳහා අවශ්‍ය අපනයන කෘෂි බෝග පැළ 9,383,310 ක ප්‍රමාණයක් නොමිලයේ ගොවීන් වෙත ලබා දෙන ලදී .

ආහාර සුරෂිතතාව ඇති කිරීම සෞඛ්‍යය හා පෝෂණය පෝෂණය වර්ධනය කිරීම හා තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම යන තිරසාර සංවර්ධන අරමුණ ඉලක්ක කරමින් කුඩා පරිමාණ ගෙවතු හා සෞභාග්‍යා ගෙවතු වගා වැඩසටහන මඟින් කුඩා ඉඩම්වල ඵලදායිතාවය ඉහළ නැංවීමටත්, මහා පරිමාණ වගාවන් ලෙස පවත්වා ගැනීමේ අඩු විභවතාවයන් පවතින වැනිලා, කරඳමුංගු, සාදික්කා සහ ගොරකා වැනි වගාවන් පොකුරු ගම්මාන ලෙස ව්‍යාප්ත කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ගෙවතු වගා වැඩසටහන 2021 වසර තුලදි ද ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන යටතේ කුඩා ගෙවතු, වානිජ ගෙවතු වානිජ වගා වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. කුඩා ගෙවතු වැඩසටහන යටතේ කහ, ඉඟුරු. කුරුඳු, ගම්මිරිස් සහ කෝපි යන බෝග ලබා දෙන ලදී. වපසරිය උපරිම අක්කර 05 ක් දක්වා වානිජ වගා වැඩසටහන යටතේ පැළ ලබා දෙන ලදී. ඒ අනුව, කුඩා ගෙවතු සඳහා අපනයන කෘෂිබෝග පැළ 3,108,129 ක් හා සෞභාග්‍යා ගෙවතු වැඩසටහන යටතේ 120,541 ක පැළ ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව මඟින් ගොවීන් වෙත නොමිලයේ නිකුත් කරන ලදී. තවද ගම්මාන වැඩසටහන යටතේ පොකුරු ගම්මාන 98 ක් සඳහා කරඳමුංගු, වැනිලා සහ සාදික්කා පැළ 104,622 ක පැළ ප්‍රමාණයක් ලබා දෙන ලදී.

තිරසාර පරිභෝජන හා නිෂ්පාදන රටා සුරක්ෂිත කිරීම ආරක්ෂා කර ගැනීමේ අරමුණින් යුතුව රජය මඟින් වියළි කහ ආනයනය කිරීම මුළුමනින්ම සීමා කිරීමත් සමඟම දේශීය වශයෙන් විශාල වගාකරුවන් පිරිසක් කහ වගාව සඳහා යොමු වී ඇත. මේ යටතේ කහ සහ ඉඟුරු වගාවන් සංවර්ධනය සඳහා ගොවීන්ට අවශ්‍ය තාක්ෂණික පහසුකම් හා දිරිගැන්වීම සඳහා ආයෝජන ආධාර ලබා දීමට යොමු කර ඇත. එමෙන්ම ගෘහස්ථ පරිභෝජනය සඳහා අවශ්‍ය කහ - ඉඟුරු අවශ්‍යතාවය තම ගෙවත්ත තුලින් නිෂ්පාදනය කිරීම අරමුණු කර ගනිමින් නාගරික සහ අර්ධ නාගරික නිවාස ඒකකවලට ප්‍රමුඛත්වය ලබාදෙමින් එක් ගෘහයක් සඳහා අවශ්‍යතාවය පරිදි කහ පැළ නොමිලේ නිකුත් කරන ලදී. ඒ අනුව 2022 වසරේදී දේශීය කහ අවශ්‍යතාවය සපුරා ගැනිමට හැකිවීම සඳහා ක්‍රියාත්මක

කල වැඩසටහන්වලට ප්‍රබල දායකත්වයක් ලබා දීමට හැකිවීම දෙපාර්තමේන්තුව ලැබූ සුවිශේෂී ජයග්‍රහණයකි.

තිරසාර සංවර්ධන ඉලක්ක අත්පත් කර ගැනීමේ දී පරිසර සංරක්ෂණය ප්‍රධාන අංගයක් ලෙස සැලකෙන අතර, පාංශු හා ජල සංරක්ෂණය කරමින් ආදායම වැඩි කිරීම සඳහා පුවක් වගාව ව්‍යාප්ත කිරීමේ වැඩසටහන 2021 වසරේදී ද ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන යටතේ , තනි වගාවක්, අතුරු හෝ මිශ්‍ර වගාවක් ලෙස වාරිමාර්ග දෙපස, ජල පෝෂක ප්‍රදේශ,මාර්ග දෙපස හා වගා ඉඩම් තුල, පරිසර සංරක්ෂණ කටයුතු සිදු කරන ස්ථාන, වතු සමාගම් ආදිය සඳහා පුවක් පැළ 1,099,420 නොමිලයේ නිකුත් කර ඇත.

දේශගුණික විපර්යාසයන් හා ස්වභාවික විපත්වලට අනුවර්තනය වීමේ හැකියාව වර්ධනය කිරීම හා තිරසාර ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය වඩා තහවුරු කිරීම සඳහා අපනයන බෝග වගාවන්හි ඵලදාව ඉහළ නංවාලීම සඳහා 2021 වසරේ දී වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලදී. වසර 2030 වන විට සාක්ෂාත් කර ගැනිමට අපේක්ෂිත සහස්‍ර සංවර්ධන අභිමතාර්ථයන් වූ දේශගුණික විපර්යාසයන් සඳහා කඩිනමින් ප්‍රතිචාර දැක්වීම හා තිරසාර ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය යටතේ ගම්මිරිස් හා කුරුඳු වගාවේ පවතින පාළු සිටුවීම සඳහා පැළ නොමිලේ ලබා දීම සිදු කරන ලද අතර, එමඟින් ඵලදායීතාවය ඉහළ නැංවීම අපේක්ෂා කරන ලදි. එහිදී, හෙක්ටයාර් 2291.17 ක් සඳහා නොමිලයේ අපනයන කෘෂි බෝගපැළ ලබා දෙන ලදී. තවද, පළිබෝධ හානි වැළැක්වීම සඳහා උපාංග/ පද්ධති ලබා දීම සඳහා උපකරණ සඳහා වැයවන වියදමින් 50% ක ආයෝජන ආධාර ලබා දෙන ලදී. ඒ යටතේ උපකරණ/ පද්ධති 80 ක් ලබා දෙන ලදී. වගාවන්ට ස්වාභාවිකව සිදුවන නියං හානි වළක්වා ගැනීම සඳහා විසුරුම් ජල පද්ධති / බිංදු ජල සම්පාදන පද්ධති සඳහා වැයවන වියදමින් 50% ක් ගොවීන් 56 ක් සඳහා ආයෝජන ආධාර මුදල් ලබා දෙන ලදී.

දේශගුණික විපර්යාසයන්ට තිරසර විසඳුම් සහිත හරිත සමාජ ආර්ථික රටාවක් කරා යන තේමාව යටතේ පරිසර හිතකාමී පොහොර සහ කෘෂි රසායනික භාවිතයට යොමු කිරීම තුලින් සෞඛ්‍යාරක්ෂිත ආහාර නිෂ්පාදනයක් හරහා නීරෝගීමත් ජනතාවක් බිහි කිරීමේ අරමුණින් යුතුව පරිසර හිතකාමී අපනයන කෘෂි බෝග වගාව ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රී ලංකා ආර්ථිකයට ඉහළ දායකත්වයක් සපයන අපනයන කෘෂි බෝග වගාවන් සඳහා කාබනික යෙදවුම් භාවිතා කරමින්, නිවැරදි කෘෂිකාර්මික පිළිවෙත් හා කාර්යක්ෂම ජල කළමනාකරණය අනුගමනය කිරීම මඟින් වස විසෙන් තොර ගුණාත්මක අපනයන බෝග නිෂ්පාදන කරා යොමු වීමේ අරමුණින් යුතුව පරිසර හිතකාමී අපනයන කෘෂි බෝග වගාවන් සඳහා ගොවීන් දිරි ගන්වන ලදී. මෙහිදි කාබනික වගාවන් හා අපනයන බෝග වගාවන් සඳහා නිර්දේශ ක්‍රියාත්මක කරන ලද අතර, එවැනි නිර්දේශයන් අනුගමනය කරනු ලබන ඉඩම් පොකුරු ගොවිපල පද්ධතියක් ලෙස කාබනික සහතිකකරණ වැඩසටහනට සම්බන්ධ කරන ලදී.

ඒ ඒ ප්‍රදේශයට ආවේණික හා නිර්දේශිත වූ පාරිසරික, සමාජීය හා කෘෂිකාර්මික කරුණු සැලකිල්ලට ගනිමින් ආර්ථිකමය වශයෙන් ඉහළ ප්‍රතිලාභයක් ලබා ගැනීමට විභවයක් පවතින අපනයන කෘෂි බෝග වර්ගය හඳුනා ගැනීම මෙහිදී සිදු කෙරේ. ස්ථාපිත කරනු ලබන අපනයන කෘෂි කලාපයක් තුළ වගාව, නිෂ්පාදන පිරිසැකසුම්කරණය, අගය එකතු කිරීම, විකිණීම සහ අපනයනය මෙන්ම සම්පූර්ණ අගය දාමය සහතික කිරීම, ප්‍රතීතනය සහ කළමනාකරණය කිරීම යනාදී ක්‍රියාකාරකම් තුළින් නිෂ්පාදනයේ අගය දාමය සංවර්ධනය කිරීම සිදු කිරීම සඳහා පහසුකම් සැපයීම සිදු කෙරේ. මෙම වැඩසටහන මඟින් ග්‍රාමීය ජනතාව ඒකරාශි කරමින් ජාතික හා ජාත්‍යන්තර වෙළඳපොළ මෙන්ම නිකේතනීය වෙළඳපොළ ඉලක්ක කොට නිෂ්පාදන සිදු කිරීම අපේක්ෂා කරන ලදී. 2021 වසර තුල අපනයන කෘෂි කලාප වැඩසටහන දියත් කරන ලදී. මෙම වැඩසටහන යටතේ කුරුදු පැළ 10,813,655 ක් සහ ගම්මිරිස් පැළ 596,174 ක් බෙදා දෙන ලදී.

තිරසාර පරිභෝජන රටා සහ නිෂ්පාදන සුරක්ෂිත කිරීමේ තිරසර ඉලක්ක අත්පත් කර ගැනීමෙහිලා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (Good Agricultural Practices) හා යහපත් නිෂ්පාදන පිළිවෙත් (Good Manufacturing Practices)ක්ෂේත්‍රය තුළ ප්‍රවර්ධනය සඳහා වූ වැඩසටහන් 2021 වසරේදී ක්‍රියාවට නංවන ලදි. එහිදී, අගය එකතු කළ නිෂ්පාදන දිරිගැන්වීම හා කාබනික වගාව දිරිගැන්වීමට ද පියවර ගන්නා ලද අතර, හෙක්ටයාර 107.3 ක් සඳහා වගා වපසරියක කාබනික ගම්මාන වැඩසටහන ක්‍රියාවට නංවන ලදි. ලෝකයේ කාබනික වගා නිෂ්පාදන සඳහා වැඩි ඉල්ලුමක් පවතින හෙයින් කාබනික නිෂ්පාදන දිරිමත් කර වස විසෙන් තොර ආහාර රටාවකට ජනතාව යොමු කරවීම හා ඒ තුලින් සෞඛ්‍ය සම්පන්න ජීවිත තහවුරු කරලීම අරමුණින් යුතුව , කාබනික වගා ගම්මාන සඳහා කාබනික වගා සහතික ලබා දීමට දෙපාර්තමේන්තුව මඟින් අවශ්‍ය සහාය ලබා දෙනු ලැබූ අතර, කාබනික වගා වැඩසටහන මඟින් කාබනික නිෂ්පාදනයන් අන්තර්ජාතිකව ඉහළ මිලකට අලෙවි කිරීමේ හා ඒ මඟින් ජනතාවගේ ආර්ථිකය ඉහළ නංවාලීම අපේක්ෂා කරන ලදී. මෙහිදී කාබනික ගොවි සංවිධාන 03 ක් සඳහා අන්තර්ජාතිකව පිළිගත් කාබනික සහතික ලබා දෙන ලදි.

වැඩි විදේශ විනිමයක් උපයා ගැනීම අරමුණු පෙරදැරිව අගය එකතු කළ නිෂ්පාදන දිරිගැන්වීම, අපනයන බෝග ආශ්‍රිත නිෂ්පාදන වල ගුණාත්මකභාවය ඉහළ දැමීම යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (Good Agricultural Practices)(GAP)හා යහපත් නිෂ්පාදන පිළිවෙත් (Good Manufacturing Practices (GMP) ප්‍රවර්ධනය සඳහා විවිධ ක්‍රියාමාර්ග දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන ලදි. යහපත් කෘෂිකාර්මික පිළිවෙත් වැඩසටහන යටතේ අදාල ප්‍රමිතීන් සකස් කිරීම සහ භාවිත සංග්‍රහ සකස් කිරීම සිදුකරන ලදී.

උචිත තාක්ෂණය භාවිතයෙන් අපනයන කෘෂිබෝග ගුණාත්මය වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ අස්වනු සැකසීමේ නවීන තාක්ෂණික උපකරණ / යන්ත්‍රසූත්‍ර / ගොඩනැඟිලි / පහසුකම් හඳුන්වා දීම හා සැපයීමේ ක්‍රියාවලියක් පමණක්ම නොව අපනයන බෝග වගාවන්ගේ ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රියාමාර්ග ඉටු කිරීමට, දේශීය හා විදේශීය ප්‍රමිතීන්ට අනුව යහපත් නිෂ්පාදන පිළිවෙත්

(GMP) අනුගමනය කරමින් අපනයන කෘෂිබෝග නිෂ්පාදනයන් හි ගුණාත්මය වැඩිදියුණු කිරීම, අගය එකතු කල නිෂ්පාදන දිරිගැන්වීම (Value Addition), රැකියා උත්පාදනය ඉහල නැංවීම අපේක්ෂා කරන ලදී.

වසර 2030 වන විට සහශ්‍ර සංවර්ධන ඉලක්ක කර ගනිමින්, අපනයන කෘෂිබෝග වගා ක්ෂේත්‍රයේ නියැලී සිටින සියළුම පාර්ශවයන් වෙත දැනුම හා කුසලතා ප්‍රවර්ධනය සඳහා පුහුණු වැඩසටහන් හා ක්ෂේත්‍ර දින 2021 වසරේ දී පවත්වන ලදී. රට තුල පැවැති කොරෝනා තත්ත්වය හමුවේ පුහුණු වැඩසටහන් පැවැත්වීමට බාධාවක් වුවද, යහපත් කෘෂිකාර්මික පිළිවෙත් හා යහපත් නිෂ්පාදන පිළිවෙත් හා අනෙකුත් පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු යොදන ලදී.

ගොවි ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කරලීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරිමේදී අවශ්‍ය වන්නා වූ පසුබිම සකස් කිරීම උපයෝගි වන්නාවූ වක්‍රලේඛ , වැඩසටහන් හා උපායමාර්ග දෙපාර්තමේන්තු මට්ටමින් සිදු කරන ලදි. මෙමඟින් අපනයන කෘෂි බෝග ක්ෂේත්‍රය සඳහා උනන්දු වන සියළුම පාර්ශ්වයන්ගේ ආර්ථිකය ශක්තිමත් කරමින් දරිද්‍රතාවය පිටු දැකීම සඳහා අවශ්‍ය ආර්ථික සම්පත් සඳහා වූ ප්‍රවේශය තහවුරු කරන ලදි. ඒ මඟින් ඍජුවම වගාකරුවන් ගේ ආදායම ඉහළ නැංවීම සඳහා දෙපාර්තමේන්තුව විසින් 2021 වසරේ දී දායකත්වය ලබා දෙන ලදි.

එහෙත් කෘෂි ව්‍යාප්ති සේවාවෙහි ඵලදායිතාව හා කාර්යක්ෂමතාව ඉහළ නංවා ඒ ඔස්සේ අපනයන ආදායම ඉලක්ක වැඩි කිරීම සඳහා ප්‍රමාණවත් භෞතික සම්පත් , මානව සම්පත් සහ ව්‍යාප්ති නිළධාරී කාර්යාලවල ප්‍රමාණවත් පහසුකම් නොමැති වීම 2021 වසර තුලදී ද මුහුණු දුන් අභියෝගයන් ලෙස පැවැතිණි.

පරිච්ඡේදය 06

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමණාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	85	62	23
තෘතියික	29	09	20
ද්විතියික	800	645	156
ප්‍රාථමික	352	238	114
මුරකරු දෙපාර්තමේන්තුගත		17	
කම්කරු දෙපාර්තමේන්තුගත		97	
එකතුව	1266	1068	313

6.2 . ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපා ඇති ආකාරය

පළපුරුදු කාර්ය මණ්ඩලය විශ්‍රාම ගැනීම සහ ඒ සඳහා යොදවනු ලබන නව කාර්ය මණ්ඩලය තුළ අදාල ක්ෂේත්‍රයේ රාජකාරි පිළිබඳව අවබෝධයක් නොමැතිකම ද ඉතිරිව සිටින පුහුණු කාර්ය මණ්ඩලය යොදවා ඉටු කර ගත යුතු කාර්යයන් වෙනුවෙන් යොදාගත හැකි නවීන යන්ත්‍ර සූත්‍ර ලබා ගැනීම සඳහා ප්‍රතිපාදන නොමැති වීම.

6.3. මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය රු'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම්/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
ගබඩා කළමණාකරණය, ඉන්වෙන්ට්‍රි පාලනය, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය හා වත්කම් අපහරණය පිළිබඳ වැඩමුළුව	02	දින 02	7500.00		දේශීය	ගබඩා කළමණාකරණය, ඉන්වෙන්ට්‍රි පාලනය, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය හා වත්කම් අපහරණය පිළිබඳ දැනුම ලැබීම තුලින් අරපිරිමැස්මෙන් හා කාර්යක්ෂමව ආයතනයේ කටයුතු සිදු කිරීමට හැකිවීම.
ආයතනික කළමණාකරන පුහුණු පාඨමාලාව -2021.04.06	03	දින 01	24,000.00		දේශීය	ආයතනික කටයුතු ඵලදායීව සිදු කිරීමට හැකිවීම.

පශ්චාත් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා	01	අවුරුදු 01	150,000.00		දේශීය	දැනුම වර්ධනය කර ගැනීම තුලින් රටේ සංවර්ධනයට වඩා ඵලදායී ලෙස දායකවීම සඳහා
මාර්ගගත ක්‍රමය ඔස්සේ පර්යේෂණ ව්‍යාපෘති වාර්තා ලිවීම පිළිබඳ පුහුණු වැඩසටහන	12	දින 01	24,000.00		දේශීය	ආයතනයේ කටයුතු සිදු කිරීමට පහසුවීම.
පශ්චාත් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා	01	අවුරුදු 01	37,500.00		දේශීය	දැනුම වර්ධනය කර ගැනීම තුලින් රටේ සංවර්ධනයට වඩා ඵලදායී ලෙස දායකවීම සඳහා
Skill Development of Use of Advance Excel Techniques -2021	22	දින 01	44,000.00		දේශීය	පරිගණක කටයුතු පහසුවෙන් ඵලදායීව කඩිනමින් සිදු කිරීමට හැකිවීම.
වැටුප් පරිවර්තන පුහුණුව	06	දින 01	42,000.00		දේශීය	නිලධාරීන්ගේ වැටුප් පරිවර්තනය කිරීම සම්බන්ධ කටයුතු කඩිනමින් සිදු කිරීමට හැකිවීම
වාහනයක යාන්ත්‍රික ක්‍රියාකාරිත්වය පිළිබඳ දැනුවත් කිරීම	03	දින 01	0		දේශීය	වාහනවල යාන්ත්‍රික ක්‍රියාකාරිත්වය සම්බන්ධ රියදුරු මහතුන්ගේ දැනුම වර්ධනය වීම තුළින් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ ප්‍රවාහන කටයුතු කාර්යක්ෂමව සිදු කිරීමය හැකිවීම.
රාජ්‍ය සේවකයාගේ සුභවාදී ආකල්ප සංවර්ධනය	01	දින 02	0		දේශීය	රාජ්‍ය සේවකයාගේ සුභවාදී ආකල්ප පිළිබඳ දැනුවත් වීම තුළින් දෙපාර්තමේන්තුවේ ඵලදායීතාව ඉහළ යාම.
ගැටළු නිරාකරණය	01	දින 02	0		දේශීය	පහසු ක්‍රම මඟින් රාජකාරී ඉටු කිරීමට හැකිවීම
කාර්යාල කළමණාකරණය හා කාර්යාල ක්‍රම	01	දින 02	0		දේශීය	කාර්යාල කටයුතු ඉක්මනින් හා ඵලදායීව ඉටු කිරීමට හැකිවීම
කාර්යාල උපකරණ භාවිතය හා නඩත්තුව	03	දින 01	0		දේශීය	කාර්යාල උපකරණ නඩත්තු කිරීමට යන පිරිවැය අඩු කිරීමට හැකිවීම
කාර්යාල කාර්ය පටිපාටිය	06	දින 02	0		දේශීය	දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂම වීම
ප්‍රසම්පාදන කාර්ය පටිපාටිය පිළිබඳ පුහුණු වැඩසටහන	06	දින 02	0		දේශීය	ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමේ දී නිලධාරීන් විසින් ලබා ගන්නා ලද දැනුම තුලින් කටයුතු කිරීමට පහසුවීම.

පරිච්ඡේදය 07

අනුකූලතා වාර්තාව

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම්	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම(වාණිජ අත්තිකාරම් ගිණුම)	අනුකූල නොවේ	පවත්වා ගෙන නොයයි.	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අනුකූල නොවේ	පවත්වා ගෙන නොයයි.	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අනුකූල නොවේ	පවත්වා ගෙන නොයයි.	
1.6	වෙනත්			
2	පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම(මූ.රෙ.445)/	අනුකූල වේ		
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලබයි.		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	වෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

03	මූල්‍ය පාලනය සඳහා කාර්යන්අභිනියෝජනය කිරීම (මු.රෙ.135)	අනුකූල වේ		
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 17/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	වාර්ෂික සැලසුම් සකස් කිරීම			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	සකස් කර ඇත.		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය ඇස්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	විගණන විමසුම්			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගනන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල නොවේ	විගණිත ආයතනවලින් නියමිත දිනට පිළිතුරු අභ්‍යන්තර විගණන අංශය වෙත නොලැබීම	විගණිත ආයතනවලින් නියමිත දිනට පිළිතුරු ඉදිරිපත් නොකිරීම.
6	අභ්‍යන්තර විගණනය			
6.1	මු.රෙ.134(2)DMA/I-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව , අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර ඇත.		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ.		

6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අභ්‍යන්තර විගණන වාර්තා වල මෘදු පිටපත් විද්‍යුත් තැපෑල මඟින් ඉදිරිපත් කර ඇත.		
6.4	මු.රෙ.134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	ඉදිරිපත් කර ඇත.		
7	විගණන හා කළමණාකරණ කමිටු			
7.1	DMA චක්‍රලේඛ1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමණාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	පැවති Covid වසංගත තත්ත්වය මත විගණන කළමණාකරණ කමිටු 03 ක් පවත්වා ඇත.		
8	වත්කම් කළමණාකරණය			
8.1	අංක 01 /201.7 දරණ වත්කම් කළමණාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව , වත්කම් මිළදී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරනය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛය සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	වාහන කළමණාකරණය			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කොට තිබීම	අනුකූල වේ.		

9.3	වාහන ලොක් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම් නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ		
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත් වල අයිතිය පවරා ගැනීම	අනුකූල වේ		
10	බැංකු ගිණුම් කළමණාකරණය			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	ප්‍රතිපාදන උපයෝජනය			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට ඵලබීම.	අනුකූල වේ		
12	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිහහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම.	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිහහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	පොදු තැන්පතු ගිණුම			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		

14	අග්‍රිම ගිණුම			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කාර තිබීම.	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම , එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය , භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15	ආදායම් ගිණුම			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම් , තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව නිහ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල නොවේ		
16	මානව සම්පත් කළමණාකරණය			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රෙල්ඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
17	මහජනයා වෙත තොරතුරු ලබා දීම			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිලිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	වර්ෂ අවසාන වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත.	

18	පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමණාකරන අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට තිබීම.	අනුකූල නොවේ	සකස් කරමින් පවතී.	
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදි පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල නොවේ	සකස් කරමින් පවතී.	
19	මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ.		
19.3	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම,ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුනතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	නිවැරදි කර ගෙන ඇත. තව දුරටත් එවැනි අඩුපාඩු නොවීමට කටයුතු කරන ලෙස අදාල ආයතන දැනුවත් කර ඇත.		

ඇමුණුම 01 - අපනයන කෘෂි බෝගයන්හි ආනයන හා අපනයන පරිමාව -2021.

නිෂ්පාදනය	ඒකකය		ආනයන	අපනයන
කුරුඳු	පරිමාව	මෙට්‍රික් ටොන්	0.09	18813.52
	වටිනාකම	රු. මි	0.09	45879.17
කුරුඳු කොළ තෙල්	පරිමාව	මෙට්‍රික් ටොන්	0.23	307.29
	වටිනාකම	රු. මි	0.36	1384.50
කුරුඳු පොතු තෙල්	පරිමාව	මෙට්‍රික් ටොන්	0.10	73.98
	වටිනාකම	රු. මි	0.22	2629.14
කරාඹු	පරිමාව	මෙට්‍රික් ටොන්	10.01	5040
	වටිනාකම	රු. මි	11.27	6521.12
කරාඹු නැටි	පරිමාව	මෙට්‍රික් ටොන්		1438.68
	වටිනාකම	රු. මි		367.02
කරාඹු තෙල්	පරිමාව	මෙට්‍රික් ටොන්	6.02	7.82
	වටිනාකම	රු. මි	30.06	92.64
කොකෝවා	පරිමාව	මෙට්‍රික් ටොන්	6184..30	1475.46
	වටිනාකම	රු. මි	4292.84	2273.99
කෝපි	පරිමාව	මෙට්‍රික් ටොන්	387.40	30.47
	වටිනාකම	රු. මි	129.87	62.33
ගම්මිරිස්	පරිමාව	මෙට්‍රික් ටොන්	59.21	17959.16
	වටිනාකම	රු. මි	68.19	22669.34
ගම්මිරිස් තෙල්	පරිමාව	මෙට්‍රික් ටොන්	1.12	81.23
	වටිනාකම	රු. මි	1.04	623.82
ඔලියරොසින්	පරිමාව	මෙට්‍රික් ටොන්	3.26	610.25
	වටිනාකම	රු. මි	18.63	3903.02
කරඳමුංගු	පරිමාව	මෙට්‍රික් ටොන්	0.51	2.61
	වටිනාකම	රු. මි	0.55	59.03
කරඳමුංගු තෙල්	පරිමාව	මෙට්‍රික් ටොන්	2.10	1.32
	වටිනාකම	රු. මි	30.88	126.64
පැහිරි	පරිමාව	මෙට්‍රික් ටොන්	0.90	4.09
	වටිනාකම	රු. මි	5.94	26.44
සේර තෙල්	පරිමාව	මෙට්‍රික් ටොන්	3.57	1.61
	වටිනාකම	රු. මි	15.51	13.96
සාදික්කා	පරිමාව	මෙට්‍රික් ටොන්	0.00	1710.29
	වටිනාකම	රු. මි	0.01	2468.01
වසාවාසි	පරිමාව	මෙට්‍රික් ටොන්	0.01	280.08
	වටිනාකම	රු. මි	0.02	1051.86
වසාවාසි තෙල්	පරිමාව	මෙට්‍රික් ටොන්	-	2.75
	වටිනාකම	රු. මි	-	10.36
සාදික්කා තෙල්	පරිමාව	මෙට්‍රික් ටොන්	5.16	50.29
	වටිනාකම	රු. මි	52.74	463.26
වැනිලා	පරිමාව	මෙට්‍රික් ටොන්	0.30	1.43
	වටිනාකම	රු. මි	2.21	30.45
වැනිලා තෙල්	පරිමාව	මෙට්‍රික් ටොන්	3.15	0.23
	වටිනාකම	රු. මි	4.02	0.58
පුවක්	පරිමාව	මෙට්‍රික් ටොන්	239.00	10516.26
	වටිනාකම	රු. මි	173.66	8669.64
බුලත්	පරිමාව	මෙට්‍රික් ටොන්	-	3833.66
	වටිනාකම	රු. මි	-	3076.90
ඉහුරු	පරිමාව	මෙට්‍රික් ටොන්	0.47	113.81
	වටිනාකම	රු. මි	0.47	100.41
ඉහුරු තෙල්	පරිමාව	මෙට්‍රික් ටොන්	2.70	5.85
	වටිනාකම	රු. මි	33.60	165.34
කහ	පරිමාව	මෙට්‍රික් ටොන්	0.80	42.38
	වටිනාකම	රු. මි	0.58	114.41
ගොරකා	පරිමාව	මෙට්‍රික් ටොන්	22.75	176.34
	වටිනාකම	රු. මි	6.28	156.01
එකතුව	**පරිමාව**	**මෙට්‍රික් ටොන්**	**6933.15**	**62580.86**
	වටිනාකම	**රු. මි**	**4879.01**	**102,939.40**

වාර්ෂික කාර්යසාධන වාර්තාව

DEPARTMENT OF EXPORT AGRICULTURE

ANNUAL PERFORMANCE REPORT

2021

ANNUAL PERFORMANCE REPORT 2021



අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

+ 94 812 388651
helpdesk@dea.gov.lk
www.dea.gov.lk

1095, Getambe, Peradeniya, Sri Lanka.

Cover Designed@ COM DIV | DEA